## කාර්ය පත්‍රිකා සංග්‍රහය - 2021

# නර්තනය

### 9 ශ්‍රේණිය



නර්තන ගුරු සංසදය
කලාප අධ්‍යාපන කාර්යාලය
අම්පාර

# පටුන


| ක්‍රියාකාරකම් අංකය | ක්‍රියාකාරකම | පිටු අංකය |
|---|---|---|
| | 1 වන වාරය | |
| 1.1 | නර්තන මාධ්‍යයෙන් මිනිස් චරිත නිරූපණය කරමු. | 3-5 |
| 2.1 | නර්තනයට පාද හුරු කර ගනිමු. | 6-9 |
| 2.2 | නර්තනයට හස්ත හා පාද හුරු කර ගනිමු. | 10-13 |
| 2.3 | අලංකාර පද නිර්මාණය මගින් රස විඳිමු. | 14-16 |
| 4.1 | ජන ගායනා වල සුවිශේෂී ලක්ෂණ හදුනාගනිමු. | 17-20 |
| 8.1 | ශාරීරික ස්වස්ථතාව හා නර්තනය | 21- 24 |
| 3.1 | ගැට බෙරය හා එහි වාදන අවස්ථා පිළිබඳ තොරතුරු විමසමු. | 25-27 |
| | 2 වන වාරය | |
| 1.3 | පන් නෙළීමේ / ගොයම් කැපීමේ නැටුම නිර්මාණය කිරීම. | 28-30 |
| 3.2 | සතර බීජාක්ෂර හා සරඹ පද වාදනය කරමු. | 31-32 |
| 2.5.1 | වන්නම් / සින්දු වන්නම් නර්තනය කරමු. | 33-35 |
| 5.1 | නර්තන කලාව හා සබැඳි මුලාශ්‍රය හදුනා ගනිමු. | 36-39 |
| 7.3 | රංග උපකරණයක් නිර්මාණය කරමු. | 40-41 |
| 1.2 | භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය කරමු. | 42- 43 |
| | 3 වන වාරය | |
| 3.3.1 | පංචතූර්ය වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු රැස් කරමු. | 44-46 |
| 2.4 | බෙර පද, වන්නම්, කවි ප්‍රස්තාර කරමු. | 47-49 |
| 5.2 | ශාන්ති කර්ම හදුනා ගනිමු. | 50- 52 |
| 5.3 | නර්තන ශිල්පීන් අගයමු. | 53-55 |
| 6.1 | කථක් නර්තනයේ තොරතුරු රැස් කරමු. | 56-58 |
| 6.2 | දේශීය නාට්‍ය ශෛලී ඉගෙන ගනිමු. | 59- 62 |
| 7.1 | ගීතයේ පසුබිම හදුනා ගනිමු. | 63-65 |

නර්තනය

9 ශ්‍රේණිය. 1 වාරය


ගුරුභවතාගේ නම : ඩබ්ලිව්.සුරංගා කසුන්මාලි අම්/පාදාගොඩ විද්‍යාලය

නිපුණතාව : 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි.

නිපුණතා මට්ටම : 1.1 පරිසරයේ දක්නට ලැබෙන මිනිස් චරිත ඇසුරින් නර්තන නිර්මාණ කරයි.

## නර්තන මාධ්‍යයෙන් මිනිස් චරිත නිරූපණය

නර්තන මාධ්‍යයෙන් මිනිස් චරිත නිරූපණයේ දී කවර හෝ චරිතයකට අයත් බාහිර චර්යාවන් අනුකරණය කළ යුතුය. එමෙන්ම මිනිස් චරිතවල සුවිශේෂ ලක්ෂණ හඳුනා ගත යුතුය. භාව ප්‍රකාශනය වඩාත් තීව්‍ර කිරීමෙන් නර්තන නිර්මාණය සාර්ථක කර ගත හැකිය.






මෙ ආදි වශයෙන් එකිනෙකට බොහෝ අසමාන ලක්ෂණ පෙන්නුම් කරන චරිත අසීමිත සංඛ්‍යාවක් අප අවට පරිසරයෙහි විද්‍යමාන වේ. මේ සෑම චරිතයකට ම බාහිරින් ප්‍රකාශ වන ලක්ෂණ මෙන්ම අභ්‍යන්තරික ගති ස්වභාව ද ඇත. එබැවින් චරිත ඇසුරින් නර්තන නිර්මාණය මනා අවබෝධයෙන් යුතු ව සිදු කළ යුතු විධිමත් රංග කාර්යයකි. මනුෂ්‍ය චරිත ඇසුරින් නර්තන නිර්මාණයේ දී නිර්මාණ ශිල්පියා විසින් විශේෂයෙන් සැලකිල්ලට ගනු ලබන්නේ චරිතය මගින් බාහිරව ප්‍රදර්ශනය කරනු ලබන ක්‍රියාකාරකම් ය. මෙහිදී නිරීක්ෂණය ඉතා වැදගත් වේ.

නිරීක්ෂණය සඳහා අවධානය යොමු කළ යුතු කරුණු :

- ගමන් විලාස හා බැඳි විවිධතා
- අංග, ප්‍රත්‍යංග හා උපාංග ආදියෙහි ක්‍රියාකාරී ස්වභාවය
- භාව ප්‍රකාශනය
- නර්තන නිර්මාණයේ දී අවස්ථාවට උචිත තාලානුකූල චලන, රිද්මයානුකූල චලන හා ප්‍රකාශනාත්මක චලන යොදා ගැනීම

**නර්තන නිර්මාණයට සුදුසු මිනිස් චරිතවල සුවිශේෂ ලක්ෂණ,**

❖ මුහුදු යන්නට සැරසෙන ධීවරයා



- ආගම ඇදහීමෙන් පසු ආම්පන්න රැගෙන වෙරළට ගොස් ඔරුව දියත් කිරීම
- විවිධාකාරයෙන් හබල් ගසා ඔරුව දියඹට ගෙන යාම
- දැල් රැගෙන ඇතට එළීම සිදු කර ඒවා ආපසු ඇද මත්ස්‍ය සම්පත ලබා ගැනීම
- අවසානයේ දී ඔරුව නැවත ගොඩට ගෙන ඒම
- පසුව වෙරළේ විශාල දැලක් අදිමින් සිටි කණ්ඩායමට එකතු වී දැල ඇදීම
- විශාල මත්ස්‍ය ප්‍රමාණයක් අසු වී සිටිනු දැක සතුටින් නැටීම

❖ කුඹල්කරු



- මැටි කැපීම
- මැටි පෑගීම
- පදම් කිරීම
- මැටි ගෙනැවිත් ගොඩ කිරීම
- මැටි භාණ්ඩ තැනීම
- සතුටින් නැටීම

❖ ගොවියා



- බිම් සැකසීම ( කෙටීම, සී සෑම, පෝරු ගෑම )
- බීජ ඉසීම
- පැළ සිටුවීම
- නඩත්තුව
- අස්වනු නෙළීම
- සතුටින් නැටීම

❖ තේ දළු නෙලන්නිය



- දළු නෙලන්නට සූදානම් වීම
- දළු නෙලීමට යාම
- දළු නෙලීම
- දළු එකතු කිරීම
- රැගෙන ගොස් භාර දීම
- සතුටින් නැටීම

**<u>මිනිස් චරිත ඇසුරින් නර්තන නිර්මාණයේ දී පැහැදිලි වන කරුණු ,</u>**

- යොදා ගන්නා චලන ලක්ෂණ එකිනෙක වෙනස් වීම
- ශක්තිය, කාලය, වේගය මෙන්ම තල දිසා හා සම්බන්ධතා විවිධාකාර ව යොදා ගැනීම
- මනුෂ්‍ය චරිතයට අදාළ නියමිත ගති ලක්ෂණ නර්තනය මඟින් පිළිබිඹු වීම
- සෑමවිට ම එකිනෙක චරිත සඳහා නර්තන නිර්මාණයේ දී චලන විවිධතා තිබීම

**<u>කාර්ය පත්‍රිකාව</u>**

➢ නිවැරදි පිළිතුරු සපයන්න.

01. නර්තන නිර්මාණයට සුදුසු මිනිස් චරිත නම් කරන්න.

02. විවිධ මිනිස් චරිතවල සුවිශේෂ ලක්ෂණ හඳුන්වන්න.

03. චරිත නිර්මාණයට සුදුසු සිද්ධියක් ගොඩ නගන්න.

➢ මිනිස් චරිතයන් හි සුවිශේෂ අවස්ථා ගෙන ඒ සඳහා යොදා ගත හැකි ක්‍රියාකාරකම් අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| චරිතය | අදාළ ක්‍රියාකාරකම් | කාලය හා ලය | උපකරණ හැසිරවීමේ අවස්ථා |
|---|---|---|---|
| | | | |

| නර්තනය | | |
|---|---|---|
| 9 ශ්‍රේණිය | I වාරය | |
| ගුරුභවතාගේ නම : ඊ. පී. සවනි දිනේශිකා | | අම්/ උක්සිරිපුර විද්‍යාලය |

නිපුණතාව : 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.1 පාද නිවැරදි ව හැසිරවීම සඳහා මූලික සරඹ ඉදිරිපත් කරයි.

## නර්තනය සඳහා පාද හුරුකර ගනිමු.



නර්තනය ඉගෙනුමට පිවිසෙන ආධුනික ශිල්පියෙකුට අවශ්‍ය කරන කායික හා මානසික පෙර සූදානමක් ඇති කිරීම අරමුණු කොට ගත් මූලික අභ්‍යාස මාලාව පා සරඹ නම් වේ. මෙම පා සරඹ උඩරට, පහතරට, සබරගමු යන දේශීය නර්තන සම්ප්‍රදායන් තුනෙහිම අන්තර්ගතය.

සරඹ අභ්‍යාස මගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත මූලික අරමුණ ලෙස පෙනී යන්නේ පාද හුරුකර ගැනීමයි. ඒ නිසාම පාද චලන සඳහා සුවිශේෂ අවධානයක් යොමුකර ඇති බව පෙනීයන හෙයින් මෙකී සරඹ සම්ප්‍රදායන් තුනෙහිදීම පොදුවේ පා සරඹ යනුවෙන් හඳුන්වනු ලැබුවත් එක් එක් සම්ප්‍රදායට ආවේනික වූ පරිභාෂිත නාමයන් භාවිතයේ ඇත. ඒ අනුව උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායේදී **පා සරඹ** නමින් ද සබරගමු නර්තන සම්ප්‍රදායේ දී **මණ්ඩි පද** නමින් ද මෙකී සරඹ මාලාව හඳුන්වනු ලැබේ. සම්ප්‍රදායන් තුනෙහිම මෙම සරඹ අභ්‍යාස සඳහා **දණ්ඩි කඳ** යොදා ගන්නා නිසා **දණ්ඩි සරඹ, දණ්ඩියමේ සරඹ** යන නමින්ද මෙම සරඹ හඳුන්වයි. සම්ප්‍රදායන් තුනෙහිම පා සරඹ දොළස බැගින් ඇත. සෑම සරඹයක් අවසානයේම හමාර පදය නැටීම පිළිවෙතයි.

එමෙන්ම පා සරඹ සමගුණ දෙගුණ (විලම්භ,මධ්‍ය) වශයෙන් සරඹ අභ්‍යාස කිරීමත් සරඹය හමාර කිරීමේදී දී මධ්‍ය ලයට පැමිණ හමාර පදය නැටීමත් සම්ප්‍රදායන් තුනටම අයත් පොදු ලක්ෂණයකි. පා සරඹ අභ්‍යාස කිරීමේදී ප්‍රධාන අවධානය පාද අභ්‍යාස කෙරෙහි යොමු වුවද එකී අභ්‍යාසයන් මගින් අතුරු අරමුණු රාශියක් ද සපුරා ගැනීමේ හැකියාව ඇත.

## පා සරඹ නැටීමේ වැදගත්කම

01.පාද හුරුකර ගැනීම.
02. මණ්ඩිය සකස් කර ගැනීම.
03. දණහිස් දෙපසට විහිද වීම සඳහා පුහුණුව
04.පාද අතර තබා ගත යුතු දුර පිළිබඳ අවබෝධය
05.ශාරීරික නම්‍යතාව ඇතිකර ගැනීම.
06. කඳ ඍජුව තබා ගැනීම.
07. දැරීමේ හැකියාව.
08. විවිධ දිශා සහ තල අනුව චලන පුහුණුව
09.ශාරීරික නිරෝගීතාවය ඇති කිරීම.
10. තාල අවබෝධය ලැබීම.
11. ඉන්ද්‍රිය සමායෝජනය.
12.පාද චලන සහ ශාරීරික සබඳතා ගොඩනැගීම.
13. චලනයන්ගේ සමබරතාවය පවත්වා ගැනීම.
14 සමමිතික බව පවත්වා ගැනීම.

## පා සරඹ නර්තනයේදී දැකිය හැකි විශේෂ ලක්ෂණ

- පාද චලන පමණක් යොදා ගැනීම.
- පද කටින් කියා නර්තනය කිරීම.
- දණ්ඩි කඳ භාවිතය.
- බෙර යොදා නොගැනීම.
- තෙයි යන පදය මූලික කොට පැවතීම.
- සරල බවේ සිට සංකීර්ණ බව දක්වා ක්‍රමයෙන් වර්ධනය වීම.

## 6 ,7, 8 ශ්‍රේණිවල පා සරඹ මතකයට නංවමු.

| | සරඹ නාමය | සරඹ පදය | හමාර පදය |
|---|---|---|---|
| 6 ශ්‍රේණිය | අඩිය | තෙයි | තෙයියත් තෙයියත් තෙයියත් තාම් තේයි තාම් තෙයි තෙයි තත් තත් තා |
| | දැඩිය | තෙයි කිට තෙයි තාම් | |
| | තුන් අඩිය | තෙයි කිට/// තෙයි තාම් | |
| 7 ශ්‍රේණිය | සිව් අඩිය | තෙයිත// තෙයි තෙයියත් තාම් | |
| | දැල අඩිය | තෙයි ති තා තෙයි | |
| | පසුපෙර අඩිය | තා තෙයියත් /// තා තෙයි | |
| 8 ශ්‍රේණිය | නුහුරු අඩිය | තා තෙයි තා තෙයියත් තාම් | |
| | කරනම් අඩිය | තෙයියත් තෙයියත් තෙයියත් තාම් තේයි තත්තක තෙයියත් තාම් | |
| | දෙපැති අඩිය | තේයි තත්තක තෙයි තෙයි තත්තක තේයි තත්තක තෙයියත් තාම් | |

## 9 ශ්‍රේණියට නියමිත පා සරඹ

- ❖ පහත සඳහන් පා සරඹ පද තාල තබා හඬ නගා කියමු. (තාලම්පට භාවිත කරන්න)
- ❖ සමගුණ හා දෙගුණ යන ලය පිලිබඳ අවබෝධයෙන් සරඹ අභ්‍යාස කරමු.

**දසවන පා සරඹය**

- ○ සරඹ නාමය - තුන් පැති අඩිය
- ○ සරඹ පදය - තෙයියත් තෙයිතා තිත් තෙයි තත්තා
- ○ තාලය - මහ තනි තිත

| | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | තෙයි | - | යත් | - | තෙයි | - | තා | - | තිත් | - | තෙයි | - | තත් | - | තා | - |
| දෙගුණ | තෙයි | යත් | තෙයි | තා- | තිත් | තෙයි | තත් | තා- | තෙයි | යත් | තෙයි | තා- | තිත් | තෙයි | තත් | තා- |

**එකොළොස් වන පා සරඹය**

- ○ සරඹ නාමය - චක්‍ර අඩිය
- ○ සරඹ පදය - තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම්
- ○ තාලය - මැදුම් තනි තිත

| | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | තෙයි | - | ත | තෙයි | - | ත | තෙයි | - | තෙයි | යත් | තාම් | - |
| දෙගුණ | තෙයි | තතෙ | යිත | තෙයි | තෙයියත් | තාම් | තෙයි | තතෙ | යිත | තෙයි | තෙයියත් | තාම් |

**දොළොස් වන පා සරඹය**

- සරඹ නාමය - සුරල් අඩිය
- සරඹ පදය - තෙයිතක තෙයිතක තෙයිතක තෙයි
- තාලය - මහ තනි තිත

| | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමගුණ | තෙයි | - | ත | ක | තෙයි | - | ත | ක | තෙයි | - | ත | ක | තෙයි | - | - | - |
| දෙගුණ | තෙයි | තක | තෙයි | තක | තෙයි | තක | තෙයි | - | තෙයි | තක | තෙයි | තක | තෙයි | තක | තෙයි | - |

**හමාර පදය** - තෙයියත් තෙයියත් තෙයියත් තාම්
තේයි තාම් තෙයි තෙයි තත් තත් තාම්

තාලය - මහ තනි තිත

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තෙයි | - | යත් | - | තෙයි | - | යත් | - | තෙයි | - | යත් | - | තාම් | - | - | - |
| තේයි | - | - | - | තාම් | - | - | - | තෙයි | - | තෙයි | - | තත් | - | තත් | - |
| තාම් | | | | | | | | | | | | | | | |

## <u>කාර්ය පත්‍රිකාව</u>

➤ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01.උඩරට නර්තන සම්ප්‍රදායේ සරඹ වර්ග

(1) අටකි (2) දොළසකි (3) දෙකකි (4) හතරකි

02. සබරගමු සම්ප්‍රදායේදී පා සරඹ හඳුන්වනුයේ,

(1) පැනීමේ සරඹය (2) සුරල් අඩිය (3) මණ්ඩි පද (4) දැල අඩිය

03. සරඹ අභ්‍යාසයේදී සමගුණ වශයෙන් හඳුන්වනුයේ .......... ලයට නැටීම ය.

(1) ද්‍රැත (2) විලම්භ (3) මධ්‍ය (4) ප්ලුත

04.ආධුනික ශිල්පියා පළමුව හදාරන අංගය

(1) අඩිය (2) පා සරඹ (3) තුන්පැති අඩිය (4) සුරල් අඩිය

05.මණ්ඩියට සිටීමේදී දෙපා අතර පරතරය

(1) වියතකි (2 ) අඟුලකි (3) මිටිරියනකි (4)තුන්වියත්තුන් ගුලයි

- හිස් තැනට සුදුසු වචනය ලියන්න.

01.දේශීය නර්තන සම්ප්‍රදායේ මූලික අංගහාරය ........................................
02. පා සරඹ නටා අවසන් කරනු ලබන පදය ........................................
03. අතීතයේදී පා සරඹ නර්තනයයේදී ආධාර කර ගත් උපකරණයකි ........................................
04. සරඹ අභ්‍යාසයේදී දෙගුණ වශයෙන් හඳුන්වනුයේ ........................................
05. පා සරඹ නර්තනය් දී යොදා ගන්නා වාදන භාණ්ඩයකි ........................................

- යා කරන්න.

| | |
|---|---|
| 1. තුන්පැති අඩිය | තා තෙයි තා තෙයියත් තාම් |
| 2. පසුපෙර අඩිය | තෙයි කිට තෙයි තාම් |
| 3. අඩිය | තෙයියත් තෙයියත් තෙයියත් තාම් තේයි තත්තක තෙයියත් තාම් |
| 4. කරනම් අඩිය | තෙයිත තෙයිත තෙයි තෙයියත් තාම් |
| 5. දැල අඩිය | තේයි තත්තක තෙයි තෙයි තත්තක තේයි තත්තක තෙයියත් තාම් |
| 6. දෙපැති අඩිය | තෙයි තක ///තෙයි |
| 7. සුරල් අඩිය | තෙයිත// තෙයි තෙයියත් තාම් |
| 8. තුන්අඩිය | තෙයි ති තා තෙයි |
| 9. සිව් අඩිය | තා තෙයියත් /// තා තෙයි |
| 10.දෑඩිය | තෙයි |
| 11.වක්‍රඅඩිය | තෙයියත් තෙයි තා තිත් තෙයි තත් තා |
| 12.නුහුරු අඩිය | තෙයි කිට තෙයිකිට තෙයි කිට තෙයිතාම් |

- පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. හමාර පදය ලියන්න.
2. පා සරඹ නැටීමෙන් ලැබෙන ප්‍රයෝජන 3ක් ලියන්න.
3. නමස්කාර කිරීමේ අපේක්ෂා 2ක් ලියන්න.
4. මණ්ඩියේ මූලික ලක්ෂණ 2ක් ලියන්න.
5. දෙවන පා සරඹය සමගුණ, දෙගුණ ලය අනුව ප්‍රස්තාර කරන්න.
6. පා සරඹ නර්තනයේ සුවිශේෂ ලක්ෂණ 2ක් ලියන්න.

**නර්තනය**

| | | |
|---|---|---|
| 9 ශ්‍රේණිය | I වාරය | |
| ගුරුභවතාගේ නම : ඊ. පී. සවනි දිනේශිකා | | අම්/ උක්සිරිපුර විද්‍යාලය |

නිපුණතාව : 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.2 නර්තනය හා සබැඳි විධික්‍රම අනුගමනය කරමින් සරඹ ඉදිරිපත් කරයි.

## සම්ප්‍රදායික නර්තනයට හස්ත පාද හුරුකර ගනිමු.



පා සරඹ නැටීමෙන් අනතුරුව ආධුනික ශිල්පියා ප්‍රගුණ කරන සරඹ ගොඩ සරඹ නම් වේ. ගොඩ සරඹ නැටීමේ අරමුණ වනුයේ දෑතේ හුරුව ලබා දීමයි. අත් ගෙන නටන නිසා අත් සරඹ යයිද කියයි. මෙහි සරඹ ගණන දොළසකි.

මෙම සරඹ නිවැරදිව පුරුදු පුහුණු වූ ශිල්පියෙකුට සම්ප්‍රදායික නර්තනයට අදාල අනෙකුත් නර්තනය ඉගෙනුමට අවස්ථාව හිමි වේ. නිශ්චිත අංගහාර හා හැඩතල පවත්වා ගැනීම නිසි ලෙස පුරුදු පුහුණු වන්නේ මෙකී සරඹ අභ්‍යාස තුලිනි. මෙම සරඹ ගොඩ නගා ඇත්තේ සරල බවේ සිට සංකීර්ණ බව දක්වා ක්‍රමයෙන් සංවර්ධනය වන ආකාරයෙනි.

පා සරඹ සඳහා මෙන් නොව ගොඩ සරඹ සඳහා එකී සම්ප්‍රදායට අනන්‍ය වූ බෙරය භාවිත කරයි. ආධුනිකයා පළමුවෙන්ම බෙර වාදනය සඳහා නර්තනය අරඹන්නේ ගොඩ සරඹ නර්තනය තුලිනි. **විලම්බ, මධ්‍ය,** ලය ප්‍රභේද අනුව නර්තනයේ යෙදෙනවා මෙන්ම බෙර වාදකයා මූලික බෙර පද වලට වයනු ලබන අලංකාර බෙර පද හඳුනාගැනීමට ද ආධුනිකයාට ප්‍රථමයෙන් අවස්ථාව ලැබෙන්නේ මෙහිදී ය.

උඩරට සම්ප්‍රදායේ සෑම ගොඩ සරඹයක් අවසානයේ ම එකී සරඹය සඳහා නිශ්චිත වූ කස්තිරමක් නටනු ලැබේ. කස්තිරමක් යනු පද කොටසක් අවසානයේදී නටන විශේෂ පද කොටසකි . ගොඩ සරඹ දොළස හැඳින්වීම සඳහා වෙනම නම් දොළසක් ඇත.

පහතරට සම්ප්‍රදායේදී මෙම සරඹ **ඉලංගම් සරඹ** නමින් හඳුන්වයි. සංඛ්‍යාව දොළසකි. අවසන් කිරීමේ පදය **ඉරට්ටිය** නමින් හඳුන්වයි. එක් එක් සරඹ සඳහා ඉරට්ටි දොළසකි. සරඹ හැඳින්වීමට විශේෂ නාමයක් නැත. සංඛ්‍යාත්මක නාමයෙන් හඳුන්වයි. ( පළමු පදය , දෙවන පදය )

සබරගමු සම්ප්‍රදායේදී **දොඹින පද** ලෙස හඳුන්වයි. කස්තිරම **හමාර පදය** ලෙස හඳුන්වයි. සරඹ දොළසකි. සරඹ දොළස සඳහාම එක් හමාර පදයකි. සරඹ හැඳින්වීමට විශේෂ නාමයක් නැත. සංඛ්‍යාත්මක නාමයෙන් හඳුන්වයි. ( පළමු පදය ,දෙවන පදය )

# 6 , 7, 8 ශ්‍රේණිවල ගොඩ සරඹ මතකයට නංවමු.

| | සරඹ නාමය | සරඹ පදය | කස්තිරම |
|---|---|---|---|
| 6 ශ්‍රේණිය | අඩිය | දොම් කිට කිට දොම් | තත් ජිත් තොං නං තා |
| | දැඩිය | දොම් කිට කිට දොම් | තත් ජිත් තක ජිත්<br>තත් ජිත් තොං නං තා |
| 7 ශ්‍රේණිය | තුන් අඩිය | දොම් කිට /// කිට දොම් | ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම් තරිකිට ජිත් තරිකිට දොම්කිට තා |
| | සිව් අඩිය | දොම් කිට /// කිට දොම් | ගත්තකු ජිත්තම් ගජිතකු ජිත්තම් ගජිං ජිංත කුඳ ගජිතකු ජිත්තම් තරිකිට ජිත් තරිකිට දොම්කිට තා |
| 8 ශ්‍රේණිය | ඇල සරඹය | දොම් කිට කිට දොම් | රුංතක ජිංතක තරිකිට කුන්දත්<br>තාග්ග ජිංතක තරිකිට කුන්දත්<br>රුංකත ජිංතක තරිකිට කුංදත් තා |
| | දැල සරඹය | දොම් කිට කිට දොම් | රුංතක ජිංතක තරිකිට කුන්දත් ///<br>තාග්ග ජිංතක තරිකිට කුන්දත් //<br>රුංකත ජිංතක තරිකිට කුංදත් තා |

## 9 ශ්‍රේණියට නියමිත ගොඩ සරඹ

- පහත සඳහන් ගොඩ සරඹ පද ලය දෙකට තාල තබා හඬ නගා කියමු. (තාලම්පට භාවිත කරන්න)
- සරඹ පදයට අදාල කස්තිරම තාල තබා කියමු.
- සමගුණ හා දෙගුණ යන ලය පිළිබඳ අවබෝධයෙන් සරඹ අභ්‍යාස කරමු.

7 සරඹය - **අංගහාර සරඹය**

පදය - දොම් කිට කිට දොම්

කස්තිරම - රුංතක ජිංතක තරිකිට කුන්දත් ///
තාග්ග ජිංතක තරිකිට කුන්දත්//
රුංතක ජිං ජිං රුංතක ජිං ජිං
රුංකත ජිංතක තරිකිට කුංදත් තා

| | /<br>1 2 3 4 | /<br>1 2 3 4 | /<br>1 2 3 4 | /<br>1 2 3 4 |
|---|---|---|---|---|
| සමගුණ | දො මි කි ට | කි ට දො මි | දො මි කි ට | කි ට දො මි |
| දෙගුණ | දොම් කිට කිට දොම් | දොම් කිට කිට දොම් | දොම් කිට කිට දොම් | දොම් කිට කිට දොම් |
| කස්තිරම | රුං තක ජිං තක<br>රුං තක ජිං තක<br>තා- ග්ග ජිං තක<br>රුං තක ජිං තක | තරි කිට කුං දත්<br>තරි කිට කුං දත්<br>තරි කිට කුං දත්<br>තරි කිට කුං දත් | රුං තක ජිං තක<br>තා- ග්ග ජිං තක<br>රුං තක ජිං ජිං<br>තා- | තරි කිට කුං දත්<br>තරි කිට කුං දත්<br>රුං තක ජිං ජිං |

8 සරඹය - **අර්ධ චක්‍ර සරඹය**

පදය - දොම් කිට කිට දොම්

කස්තිරම - රුංතක ජිංතක තරිකිට කුන්දත් ///

තාග්ග ජිංතක තරිකිට කුන්දත් //

රුංතක ජිං ජිං රුංතක ජිං ජිං

රුංකත ජිංතක තරිකිට කුඳ කුඳ

තාග්ග ජිංතක තරිකිට කුන්දත්

රුංතක ජිංතක තරිකිට කුංදත් තා

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| සමගුණ | දො මි කි ට | කි ට දො මි | දො මි කි ට | කි ට දො මි |
| දෙගුණ | දොමි කිට කිට දොමි | දොමි කිට කිට දොමි | දොමි කිට කිට දොමි | දොමි කිට කිට දොමි |
| කස්තිරම | රුං තක ජිං තක<br>රුං තක ජිං තක<br>තාග් ග ජිං තක<br>රුං තක ජිං තක<br>රුං තක ජිං තක | තරි කිට කුං දත්<br>තරි කිට කුං දත්<br>තරි කිට කුං දත්<br>තරි කිට කුඳ කුඳ<br>තරි කිට කුං දත් | රුං තක ජිං තක<br>තාග් ග ජිං තක<br>රුං තක ජිං ජිං<br>තා- ග්ග ජිං තක | තරි කිට කුං දත්<br>තරි කිට කුං තක<br>රුං තක ජිං ජිං<br>තරි කිට කුං දත් |

9 සරඹය - **දෑත පැගීමේ සරඹය**

පදය - දොම් කිට/// කිට දොම්

කස්තිරම - තකට තකට තක තරිකිට කුංදත් /// ගජිං

| | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 | / 1 2 3 4 |
|---|---|---|---|---|
| සමගුණ | දො මි කි ට | දො මි කි ට | දො මි කි ට | කි ට දොමි - |
| දෙගුණ | දොමි කිට දොමි කිට | දොමි කිට කිට දොමි | දොමි කිට දොමි කිට | දොමි කිට කිට දොමි |
| කස්තිරම | තක ටත කට තක<br>තක ටත කට තක | තරි කිට කුං දත්<br>තරි කිට කුං දත් | තක ටත කට තක<br>ගජිං | තරි කිට කුං දත් |

<u>කාර්ය පත්‍රිකාව</u>

➢ සරඹ නාමය පිළිවෙළට සැකසීම සඳහා අදාල අංකය ඉදිරියෙන් ඇති කොටුවෙහි යොදන්න.

- දැඩිය [ ]
- අංගහාරය [ ]
- සිව් අඩිය [ ]
- ඇල සරඹය [ ]
- අර්ධචක්‍රය [ ]
- අඩිය [ ]
- තුන් අඩිය [ ]
- දෑත පැගීමේ සරඹය [ ]
- දෑල සරඹ [ ]

- වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.

( දැතේ හුරුව , දවුල , පා සරඹ , හමාරපදය , අත් සරඹ , ගොඩ සරඹ , කස්තිරම , පාද හුරුව , අඩව්ව , .ගැට බෙරය )

01. පා සරඹ නැටීමෙන් අනතුරුව ආධුනික ශිල්පියා................ප්‍රගුණ කරයි.

02. ගොඩ සරඹ නැටීමේ අරමුණ වනුයේ..................... ........... ලබාදීමයි.

03. අත් ගෙන නටන නිසා................................................ ලෙස හඳුන්වයි.

04. පද කොටසක් අවසානයේ දී නටන විශේෂ පද කොටස................... වේ.

05. ගොඩ සරඹ නර්තනය සඳහා .......................................... භාවිත කරයි.

- පහත ප්‍රශ්න සඳහා ආදාල පිළිතුරු ඉදිරියෙන් ලියන්න.

01. නර්තනයේ මූලික අංගහාරය...................... ( දණ්ඩිය / මණ්ඩිය )

02. ගොඩ සරඹ ගණන ..................... ( 12 / 18 )

03. නර්තනයට පෙර පළමුවම සිදු කරයි.................... ( පා සරඹ / නමස්කාරය )

04. උඩරට නැටුමේ සරඹ ගණන. ....................... ( 12 / 02 )

05. තාල තැබීමට උචිත භාණ්ඩය................. ( ගැටබෙරය / තාලම්පට )

06. සමගුණ ලෙස හඳුන්වන්න්...................... ( මධ්‍ය / විලම්භ )

07. සරඹ 12 සඳහාම එක් හමාරපදයකි......... ( සබරගමු සාම්ප්‍රදාටයේ / පහතරට සාම්ප්‍රදායේ)

08. මධ්‍ය ලය ලෙස හඳුන්වන්නේ..................... ( ද්‍රැතලය / දෙගුණය )

09. සිව් අඩියේ කස්තිරමට සමාන කස්තිරමක් ඇත්තේ ............ ( 2 සරඹයේ / 3 සරඹයේ )

10. තත් ජිත් තක ජිත් මෙසේ ආරම්භ වන්නේ ................... ( 1 සරඹයේ / 2 සරඹයේ )

- පහත සඳහන් කස්තිරම සම්පූර්ණ කරන්න

රුංතක ජිංතක ...................................///
.................................තරිකිට කුන්දත් //
.............................................................
රුංකත ජිංතක .................................
.....................................තරිකිට කුන්දත්
........................................................

- පහත සඳහන් පද සම්බන්ධතාවය දැක්වෙන පරිදි යා කරන්න.

| | | |
|---|---|---|
| උඩරට | ඉලංගම් සරඹ | හමාරපදය |
| පහතරට | දොඹින පද | කස්තිරම |
| සබරගමු | ගොඩ සරඹ | ඉරට්ටිය |

- දොම් කිට කිට දොම් යන පදය සමගුණ හා දෙගුණයට ප්‍රස්තාර කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| සමගුණ | | | | |
| දෙගුණ | | | | |

| නර්තනය | | |
|---|---|---|
| 9 ශ්‍රේණිය | 1 වාරය | |
| ගුරුභවතාගේ නම : ඊ. පී. සවනි දිනේශිකා | | අම්/ උක්සිරිපුර විද්‍යාලය |

නිපුණතාව : 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.3 සම්ප්‍රදායික නර්තන ඇසුරෙන් අලංකාර පද (මාත්‍රා) නිර්මාණය කරයි.

## බෙරහඬ මැද්දේ නටමු පද සිත් සේ



පරිසරය →



වර්ණ නාද චලන හැඩතල නිසා අලංකාර වේ.

## නර්තනයක සුන්දරත්වය දැකීමට අවශ්‍ය කුමක්දැයි සොයා බලමු.

- ශරීරයේ විවිධ කොටස් (අංග, උපාංග, ප්‍රත්‍යාංග) රිද්මයකටත් තාලයකටත් චලනය කිරිම නර්තනය වේ.
- නර්තනය ශරීර සෞඛ්‍යය ඉතා යහපත් ලෙස පවත්වා ගැනීමටත් ශරීරයේ හැඩය පවත්වා ගැනීමටත් උපකාරී වෙයි.
- ඔබ මීට පෙර පා සරඹ,ගොඩ සරඹ, වන්නම්, ගැමි නැටුම් හා ගීත අනුව නර්තනයේ යෙදී ඇත.
- පා සරඹ ගොඩ සරඹ යනු සම්ප්‍රදායික නර්තනයේ මූලික පදනමයි.
- **ඔබ උගත් පා සරඹ ගොඩ සරඹ සඳහා, කැරකීම්, වාඩිවීම්, උඩ පැනීම්, විවිධ දිශා වලට ගමන් කිරීම ආදිය එක්කර නර්තන නිර්මාණය කිරීමෙන් එම නර්තනයේ රසය වැඩි කරගත හැක .**
- රසය වැඩි කරගත් නර්තන වල ඇතුලත් නර්තන පද අලංකාර මාත්‍රා ලෙස හැඳින්විය හැක.
- මෙසේ ශාස්ත්‍රීය නර්තන අලංකාර කිරීමට යොදා ගනු ලබන එක් මාධ්‍යයක් ලෙස අලංකාර මාත්‍රා හැඳින්විය හැක.
- වෙනත් නර්තන නිර්මාණ සඳහා ද අලංකාර මාත්‍රා භාවිත කල හැකිය.

## අලංකාර මාත්‍රා නිර්මාණය

❖ **අලංකාර මාත්‍රා නිර්මාණයේදී අවකාශය මනාව භාවිත කල යුතුයි.**

අවකාශය යනු තමා වටා ඇති ඉඩකඩ ප්‍රමාණයයි. අවකාශ භාවිතය යනු නර්තනයකදී අපට ලබා ගත හැකි ඉඩ ප්‍රමාණය හඳුනාගැනීම හා එයින් උපරිම ප්‍රයෝජන ගැනීම වේ. අවකාශය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.



**පුද්ගල අවකාශය**

නර්තනයකදී එක් පුද්ගයකු විසින් අත්පත් කරගන්නා ඉඩ ප්‍රමාණය



**පොදු අවකාශය**

නර්තනයකදී සමූහයක් විසින් අත්පත් කර ගන්නා ඉඩ ප්‍රමාණයයි.

.

❖ **නර්තන නිර්මාණයකදී වාඩිවීම්, උඩ පැනීම් භාවිත කරමින් අලංකාර පද නිර්මාණය.**

නර්තනයකදී විවිධ තල භාවිතය මඟින් අලංකාර පද නිර්මාණය කල හැක. අවකාශයේ ශරීරය රඳවා ගනු ලබන ස්ථාන තල නම් වේ. චලනයක් සිදු කරන්නේ කවර හෝ තලයක් මත හිඳය. තල තුනක් ලෙස දැක්විය හැකිය.



**මැද තලය**



**ඉහළ තලය**



**පහළ තලය**

❖ **නර්තන නිර්මාණයකදී ඉදිරිපසට හා පසුපසට කැරකීම් භාවිත කරමින් අලංකාර පද නිර්මාණය**

නර්තනයකදී පැනීම් කැරකීම් භාවිතය මඟින් අලංකාර පද නිර්මාණය කල හැක. ඉදිරියට කැරකීම පසුපසට කැරකීම අර්ධව කැරකීම යොදා ගනී. ඉදිරියට පැත්තට ඉහලට පැනීම් යොදා ගනී.





❖ **නර්තන නිර්මාණයක දී විවිධ දිශා වලට ගමන් කරමින් අලංකාර පද නිර්මාණය.**

නර්තනයකදී විවිධ දිශා භාවිතය මඟින් අලංකාර පද නිර්මාණය කල හැක . චලනයක් තුලින් මතු වන්නේ කිසියම් ජ්‍යාමිතික හැඩයකි. චලන කිහිපයක් එක් වීම ජ්‍යාමිතික හැඩතල සමූහයකගේ සංයෝගයයි. මෙම හැඩතල ඒකාකාර රටාවක් ලෙස නොපවතී. මොහොතින් මොහොත වෙනස් වේ. සුන්දරත්වයක් ඇති වන්නේ මෙසේ වෙනස් වන හැඩයන් තුලිනි.

- 6 , 7 ,8 ශ්‍රේණියේදී ඔබ 12 / 12 හා 12 / 123 හා 123/123 තිතට අලංකාර පද නිර්මාණය කරන ලදී.
- එම අලංකාර පද මතකයට නංවා ගනිමින් ඉහත උපදෙස් අනුව විවිධත්වයක් මතුවන පරිදි 9 ශ්‍රේණියට අදාල මාත්‍රා 4 + 4 තිතට අලංකාර පද නිර්මාණය කරමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| **තාලය** | **-** | **1234 / 1234 ( මහ තනිතිත)** | **බෙර පදය** | **-** | **දො දොංත තකු දොං** |

- නිර්මාණය කරගත් අලංකාර පද නිරන්තර අභ්‍යාසයේ යෙදීමෙන් ප්‍රායෝගික කුසලතාව වර්ධනය වේ.

**<u>අලංකාර පද නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු,</u>**

- සම්ප්‍රදායික නර්තනයට හානි නොවන අයුරින් අලංකාර පද නිර්මාණය කල යුතයි.
- සම්ප්‍රදායට ආවේනික චලන භාවිත කල යුතුයි.
- නිවැරදි අංගහාර පවත්වා ගනිමින් නර්තනය කල යුතුයි.
- අවකාශය මනාව භාවිත වන පරිදි අලංකාර මාත්‍රා නිර්මාණය කල යුතුයි.

<u>කාර්ය පත්‍රිකාව</u>

➢ **පහත සඳහන් ප්‍රශ්න සඳහා හරි නම් (✓) ලකුණද වැරදි නම් (x) ලකුණද යොදන්න**

01.සම්ප්‍රදායික නර්තනයට හානි වන අයුරින් අලංකාර පද නිර්මාණය කල යුතයි. ( )

02. අලංකාර පද නිරන්තර අභ්‍යාසයේ යෙදීමෙන් ප්‍රායෝගික කුසලතාව වර්ධනය නොවේ. ( )

03.12 / 123 තාලයට අයත් බෙර පදයකි ජිං ගත ගො ගො. ( )

04.නර්තන නිර්මාණයකදී විවිධ දිශා වලට ගමන් කරමින් අලංකාර පද නිර්මාණය කල හැක. ( )

05.නර්තනය ශරීර සෞඛ්‍යය ඉතා යහපත් ලෙස පවත්වා ගැනීමට උපකාරී නොවේ. ( )

➢ **හිස් තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න**
(අවකාශය/ පරිසරය / අංගහාර / මූලික/ වාඩිවීම්, උඩ පැනීම් )

01.පා සරඹ ගොඩ සරඹ යනු සම්ප්‍රදායික නර්තනයේ............................ පදනමයි.

02.නර්තන නිර්මාණයකදී ..................................භාවිත කරමින් අලංකාර පද නිර්මාණය කරයි.

03.අලංකාර මාත්‍රා නිර්මාණයේදී ................................ මනාව භාවිත කරයි.

04.වර්ණ නාද චලන හැඩතල නිසා............................ අලංකාර වේ.

05. නිවැරදි............................ පවත්වා ගනිමින් නර්තනය කල යුතුයි.

➢ **පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

01 නර්තනය යන්න කෙටියෙන් හඳුන්වන්න.

02 නර්තනයේදී භාවිත අවකාශයේ ප්‍රධාන කොටස් දෙක ලියන්න.

03 නර්තනයකදී භාවිතයට ගන්නා තල තුන නම් කරන්න.

04 අලංකාර පද නිර්මාණය සඳහා භාවිත කළ විධික්‍රම 2ක් ලියන්න.

05 නිර්මාණය කර ගත් අලංකාර පද නිරන්තරයෙන් අභ්‍යාස කිරීමෙන් ලැබෙන වාසි 2ක් ලියන්න.

| | | |
|---|---|---|
| | නර්තනය | |
| 9 ශ්‍රේණිය | I වාරය | |
| ගුරුභවතාගේ නම : Y.G.U.S. රාජපක්ෂ | | අම්/සද්ධාතිස්ස ජාතික පාසල |

නිපුණතාව : 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගායනා වල පසුබිම අධ්‍යන කරමින් ගායන කුසලතා ප්‍රදර්ශණය කරයි.

නිපුණතා මට්ටම : 4.1 නිර්දේශිත ගායනා වල සාමාජීය හා සංස්කෘතික පසුබිම විස්තර කරයි.

## කඩතුරා කවි/ පන් නෙලීමේ කවි/ ගොයම් කවි සහ සොකරි ගායනා හා සබැඳි සමාජ සංස්කෘතික පසුබිම විස්තර කරයි.

6,7,8 ශ්‍රේණි වලදී මෙතෙක් උගත් ගායනා පිළිබඳ දැනුම භාවිතා කරමින් පහත ගායනා අධ්‍යනය කරමු.

### කඩතුරා කවි හා බැඳි සමාජ සංස්කෘතික පසුබිම හඳුනාගනිමු.



උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන් තුනටම පොදු වූ ගායනා විශේෂයකි. මෙම ගායනා වල බෞද්ධාගමික ලක්ෂණ අන්තර්ගත වේ.ශාන්ති කර්ම වල රංග සැරසිලි ආතුරයාට නොපෙනෙන පරිදි යොදන සුදු පිරුවටය “ කඩතුරාව” නම් වේ. ආතුරයා හා පිදේනි තටු මැස්ස අතරට ද සුදු පිරුවට අදිනු ලබන්නේ එය ආතුරයාට නොපෙනීම සඳහාය. මෙම අවස්ථා සම්ප්‍රදායන් 3හිම දක්නට ලැබේ. විවිධ නාද මාලාවන්ට අනුව ගායනා කරනු ලබන අතර ඒ ඒ සම්ප්‍රදායන්ට අනුව නාද මාලාව වෙනස් වේ. කඩතුරා කවි ගායනයෙන් පසු එම සුදු පිරුවට ඉවත් කරනු ලබයි. තවද බලි ශාන්ති කර්ම වලදි අඹන ලද බලි රූපය නොපෙනෙන ලෙසත් , ආතුරයා ඉදිරියෙනුත් මෙම සුදු පිරුවට හෙවත් කඩතුරා අදිනු ලබයි.

**කඩතුරා කවි භාවිතා වන අවස්ථා,**

- ග්‍රාමීය ජන සමාජයේ අවශ්‍යතා පූර්ණය කිරීමට
- ගෘහස්ත හා පොදු ශාන්ති කර්ම වලදී
- සිංහල සංස්කෘතිය හා බැඳුනු සාරධර්ම, චාරිත්‍ර විධි ඇතුලත් අවස්ථාවලදී භාවිතා කිරීම.

### කඩතුරා කවි

තාල රූපය මාත්‍රා 3 + 3

සිද්ධ මුනිඳු වැඩ හිද බෝ මුල විදුරාසන
යුද්ධ කරන්නට දසබිම්බර විත් පැරදුණ
වැද්ද නොදී හැම පිරිපත දුරලා හරිමිණ
බුද්ධ රත්න අනුහසයෙන් කඩතිර අරමිණ

# පන් නෙලීමේ කවි හා බැඳී සමාජ සංස්කෘතික පසුබිම

අතීතයේදී ගැමි ලියන් අතර ප්‍රචලිත ගෘහස්ත කර්මාන්තයක් ලෙස පන් කර්මාන්තය හැදින්විය හැකිය. මෙම කර්මාන්තය ආශ්‍රිතව නිර්මාණය වී ඇති කවි විශේෂය පන් කවි නම් වේ.

පන් ආශ්‍රිත ක්‍රියාකාරකම් හා බැඳි දිවි පෙවෙතේ සහජීවනය, එකමුතුකම, සහයෝගය, සරල බව මෙම ගායනා තුලින් විද්‍යාමාන වේ. සරල නාද මාලාව නිසා මෙම පන් කවි ජනප්‍රිය ගායනා වෙසසකි.

පන් කවි සඳහා **"පැදුරු මාලයේ"** කවිත් පහතරට **" හත් අඩියේ "** යෙදෙන කවිත්, **"රට යකුම් ශාන්ති කර්මයේ"** දී පැදුරට කියනු ලබන කවිත් **"පුරාණ පන්නන් කතුර"** පොතේ සඳහන් කවිත් උපුටා ගෙන ඇත.

පන් ආශ්‍රිත නිර්මාණ ලෙස වට්ටි, පෙට්ටි, පැදුරු, මාගල්, පන් මළු, ආදිය සඳහන් කල හැකිය. එහිදි විවිධ නිර්මාණ සඳහා සුදුසු පන් වර්ගද දක්නට ලැබේ. එකී පන් වර්ග ගැන කියවෙන කවිද අසන්නට ලැබේ . ( ගල්ලැහැ, තුන්හිරියා, බොරුපන්, පොතුපන් ඒ අතර සුවිශේෂ වේ.)

"තුන්හිරියා මල් හිසට ඔබාදෝ
ගල්ලැහැ පන් බඹරු සිටිදෝ
බොරුපන් මල් නැත කොතන ගියාදෝ
පන් නෙළුමට ළද විලට බසීදෝ"



## පන් ආශ්‍රිත නිර්මාණ භාවිතා වන අවස්ථා,

- අතීතයේදී අමුත්තන්ට වාඩි වීම සඳහා යොදා ගනී.
- විවාහ චාරිත්‍ර වලට
- පැදුරේ දැපවිල්ල
- දරුහැව ගෙන යාමේදී රංග භාණ්ඩයක් ලෙස
- සොකරි ගැමි නාටකයේ රංග භාණ්ඩයක් ලෙස

## පන් කවි

**තාල රූපය මාත්‍රා 3 + 3 හෝ 2 + 4 දෙතිත**

ඉර සඳ පාන විල කොතනද තුන්හිරියා
ඉර සඳ පාන විල මෙතනයි තුන්හිරියා
පන් කම් කරන අහනෝ කාටත් සරියා
මට පැදුරකට පන් දෙනවද තුන්හිරියා

**මාත්‍රා 3 + 3**

ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට
මුහුණ පුරා තෙල් ගාගෙන යන කලට
මාන බලති මිනිවන් පන් තිබෙන කොට
නැනේ නුඹත් එනවද පන් නෙලන්නට

## ගොයම් කවි හා බැඳි සමාජ සංස්කෘතික පසුබිම හඳුනා ගනිමු.

අතීතයේ සිටම කෘෂිකාර්මික ජීවන රටාවකට හුරු පුරුදුව සිටි අපේ පැරැන්නන් වී ගොවිතැන අපේ ප්‍රධාන ජීවනෝපාය කර ගත්හ. එහිදී ඇති වන විඩාව , පාළුව, මහන්සිය මඟ හරවා ගැනීම සඳහා ගොයම් කැපීමේ කවි ගායනා කරන ලදී. මෙම ගායනා තුල ප්‍රාග් බෞද්ධ ගැමි ඇදහිලි හා බැදුණු ස්වභාව ධර්මයේ වස්තු වන්දනාව හා බැදුණු බොහෝ අංග ලක්ෂණ ඇත. ඉර, හඳ , මිහිකත වෙතින් අවසර ලබා ගැනීම එයට කදිම සාධකයකි. විවිධ නාද මාලාවන්ට හා සරල තාල රටාවන්ට , සරල බස් වහර අනුව ගැයෙන මේ ගී තුල ගැමි සමාජය තුල පවතින සාරධර්ම , සාමූහික බව , එකමුතු බව ආදිය අන්තර්ගතය.

" ඉර දෙවියන්ගේ ඉර ගල ගාවා....."

### ගොයම් කවි

එපා කියන තැන තැන නොසිටිල්ලා
පිපාසනම් දියවර බීපල්ලා
අපහසුනම් සෙවනේ සිටපල්ලා
කපා ගොයම් කඩිනම් කරපල්ලා



## සොකරි කවි හා බැඳි සමාජ සංස්කෘතික පසුබිම

උඩරට වන්නි ප්‍රදේශය හා බදුල්ල ආදි ප්‍රදේශ වල පවතින ගැමි සමාජයේ ප්‍රචලිත ගැමි නාටකයක් ලෙස සොකරි නාටකය හැදින්වේ. එහි අන්තර්ගත කවි විශේෂය සොකරි කවි නම් වේ.



මෙම නාටකයේ අන්තර්ගත චරිත මුල් කොට ගෙන එහි කතා ප්‍රවෘත්තිය විකාශය වන්නේ කවි ගායනා ඔස්සේය. නාට්‍යය පැවැත්වීමේ අරමුණ, එහි චරිත වල ස්වභාවය ආදිය මෙන්ම විවිධ අවස්ථා නිරූපණ දැක්වීමට ද කවිය භාවිතා කොට ඇත. එකම තාල රූපයකට ගැයෙන මෙම කවි ( දොං ජිජි ගත) මාත්‍රා තුනේ තනි තිතට අයත් වේ. එසේම සරල බස් වහරක් යොදා ගනී.

### සොකරි කවි

තාල මාත්‍රා 3 + 3

වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙච්ලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඩලන්නේ
විදා පාන්නේ අත් දෙක තැගි තියන්නේ

## <u>කාර්ය පත්‍රිකාව</u>

- පහත වාක්‍ය කියවා හිස් තැන් පුරවන්න.

1. ........................... යනු ආතුරයා ඉදිරියෙන් ඇඳ ඇති සුදු පිරුවටයයි.
2. ........................... යනු පන් විශේෂයකි.
3. සොකරි ගායනා ................................ තාල රූපයට ගායනා කෙරේ.
4. හත් අඩියේ කවිද .................. කවි සඳහා යොදා ගෙන ඇත.
5. පැදුර රංග භාණ්ඩයක් ලෙස යොදා ගනු ලබන්නේ ................................. නාටකයේදීය.

- **පහත දක්වා ඇති ඡායා රූප ඇසුරින් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**


A


B


C


D

(1) A,B,C,D රූප අතුරින් ජන නැටුම් සඳහා නිර්මාණය වූ ගායනා අසන්නට ලැබෙන්නේ ( )

(2) ඉහත රූප අතරින් ජන නාටකයක් දැක්වෙන ඡායා රූපය වන්නේ ( )

(3) ගෘහස්ත කර්මාන්තයක් ආශ්‍රිතව නිර්මාණය වූ ජන ගායනා ඇතුලත් වන්නේ ( )

(4) ශාන්ති කර්ම තුලදී අසන්නට ලැබෙන ගායනා ඇතුලත් වන්නේ ( )

(5) කෘෂිකර්මාන්තයට ප්‍රධාන තැනක් හිමි වන ඡායා රූපය වන්නේ ( )

- පහත සියලුම ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

01. කඩතුරා කවි හා බැඳි සුවිශේෂී ලක්ෂණ 2ක් ලියන්න.

02. ගොයම් කවි හා බැඳි සමාජ ලක්ෂණ 2ක් ලියන්න.

03. සොකරි කවි අසන්නට ලැබෙන ප්‍රදේශ 2ක් නම් කරන්න.

04. පන් කවි ගායනා සඳහා උපුටා ගත් ගායනා වර්ග නම් කරන්න.

05. ඔබ කැමති ජන ගායනාවක් ලියා දක්වන්න.

| නර්තනය | | |
|---|---|---|
| 9 ශ්‍රේණිය | 1 වාරය | |
| ගුරුභවතාගේ නම : පි.ටෙක්ලා කුමාරි ගුණවර්ධන මිය | | අම්/ වාවින්න විද්‍යාලය |

නිපුණතාව 8.0 : නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරිරික ස්වස්ථතාව සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට ඉවහල් කර ගනියි.

නිපුණතා මට්ටම 8.1: මානසික ස්වස්ථතාව පවත්වා ගැනීමේ වැදගත්කම විස්තර කරයි.

## ශාරීරික ස්වස්ථතාව

කායික,මානසික නිරෝගිතාවයෙන් ඔබ්බට ගිය සාමාජීය හා අධ්‍යාත්මික සංවර්ධනය ස්වස්ථතාව ලෙසින් හැදින්විය හැක. කෙනෙකු යහපත් මානසික සුවතාවයකින් පසු වන්නේද යන්න ඔහුගේ චර්යා රටාවෙන්, සිතුවිළි වලින්, චිත්තවේග ප්‍රකාශනය තුළින් හදුනා ගත හැකිය. කෙනෙකු කායිකව කෙතරම් නිරෝගි වුවත් ඔහුට මානසික සුවතාවයක් නොවේ නම් ඔහු මනා ස්වස්ථතාවයකින් හෙබි පුද්ගලයකු ලෙසින් පෙන්වා දිය නොහැකිය. නූතන වෛද්‍ය විද්‍යාවේ සොයා ගැනීම් අනුව බොහෝමයක් රෝග සඳහා මානසික අසහනය මුල් වන බව කියති. මානසික සමතුලිතතාවයකින් යුක්ත නොවන්නා අන් අය නුරුස්සයි.ඉක්මනින් කෝපයට පත්වෙයි.ඔවුන් නොදැනුවත්ම සමාජයෙන් කොන් වෙයි. අන් අය විසින් නොසලකා හරි.









## ස්වස්ථතාව කෙරෙහි බලපාන සාධක

**1.** මානසික සාධක

**2.** කායික සාධක

### මානසික සාධක

යම් කිසිපුද්ගලයකු ශාරිරික වශයෙන් කොතරම් ශක්තිමත් වුවත් පැයැයෙන් හැඩයෙන් කොතරම් ලස්සන වුවත් ඔහුගේ මානසික තත්වයන් සංවර්ධනය වී නොමැති නම් ඔහු මනා ස්වස්ථතාවයකින් හෙබි පුද්ගලයකු ලෙසින් පෙන්වා දිය නොහැකිය. කෙනෙකුගේ මානසික ස්වස්ථතාව යහපත්වීමට කාරණා රාශියකි.

## මානසික ස්වස්ථතාව සඳහා බලපාන සාධක

- පවුල
- වටපිටාව
- අන්තර් පුද්ගල සබඳතා
- රැකියාව
- මානසික පීඩනය
- ආරවුල්
- චිත්තවේග

### යහපත් මානසික වටපිටාවන්





### අයහපත් මානසික වටපිටාවන්





### කායික සාධක

"ආරෝග්‍යා පරමා ලාභා" නිරෝගිකම උතුම්ම ධනයයි. සැබවින්ම කෙනෙකුගේ ශාරිරික නිරෝගිතාවය නොඑසේ නම් ලෙඩ රෝග වලින් තොර වීම ජීවිතයේ ලද වටිනාම සම්පතකි.මන්ද යත් රෝගී බව පුද්ගලයකු ශාරිරිකව මෙන්ම මානසිකව ද අවතැන් කරන නිසාය.

## කායික ස්වස්ථතාව සඳහා බලපාන සාධක

- පවුල
- පෝෂණය
- රැකියාව
- මාංශ පේෂි වල ශක්තිමත් බව හා මනා ක්‍රියාකාරිත්වය
- නම්‍යශීලි බව, සමබරතාවය
- මනා පෙනුම හා හැඩය
- ඉන්ද්‍රිය සමායෝජනය
- සමබර පෞරුෂය

### යහපත් කායික වටපිටාවන්




## අයහපත් කායික වටපිටාවන්

## ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීම සඳහා නර්තනයේ වැදගත්කම

❖ නර්තනය ප්‍රායෝගික ක්‍රියාවලියකි. ශරීරය එහි මෙවලමයි. එහිදී අංග, ප්‍රත්‍යාංග, උපාංග ආදි කොට ඇති සෑම කොටසක්ම ක්‍රියාත්මක වෙයි.එමගින්

- සමබරතාව
- නම්‍යශීලි බව
- ලෙඩ රෝග වලට ඔරොත්තු දීමේ හැකියාව
- කාර්යක්ෂමතාව
- ප්‍රසන්න හා ප්‍රියමනාප වීම
- සිරුර හැඩ වීම
- මාංශ පේශි වර්ධනය හා ශක්තිමත් බව

ආදි වූ ඉන්ද්‍රිය සමායෝජනයක් ඇති වේ. නර්තනය තුළින් ලැබෙන මෙම කායික හුරුව පුද්ගලයකුගේ ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීම සඳහා බොහෝ සෙයින් ඉවහල්වේ

❖ නර්තනය කලාවකි. එමගින් එහි නියැලෙන්නා මෙන්ම බලා සිටින්නාද රස වින්දනයට පත් වේ. එසේම නර්තනය බොහෝ විට ප්‍රායෝගික, සාමුහික, දෙවියන් බුදුන් මුල් කොට ගත් පූජාර්ථය මෙන්ම විනෝදාස්වාදය ද මුල් කරගත් කලාවකි. එම නිසා මෙම නර්තනය කලාව තුළින්

- ආගම, දහමට, ගුරුවරුන්ට, දෙමාපියන්ට, වැඩිහිටියන්ට ගරු කිරීම.
- අනෙකුත් කලාවන්ට ගරු කිරීම හා පරිසරයට ආදරය කිරීම
- ඉවසීම, දැරීමේ හැකියාව, අන්‍යන්ට ගරු කිරීම, සහයෝගය, නිවරදි තීරණ ගැනීම
- අන්‍ය කලාකෘති අගය කිරීම, රස වින්දනය, ආචාරශීලී බව, ආගන්තුක සත්කාර
- ස්වාධීන චින්තනය වර්ධනය වීම, නිදහස, සාමය පිළිබඳ හැඟීම් වර්ධනය.
- විචාරශීලි මනසක් ඇති වීම හා මානසික ඒකාග්‍රතාවය
- මානසික ආතතිය අඩු වීම හා ස්වයං හික්මීම

ආදී වූ බොහෝමයක් යහ පුරුදු මෙන්ම යහපත් ආකල්පයන් නර්තනය කලාව තුළින් අප ජීවිතය හා බද්ධ වෙයි. මේ සියල්ල එක් වූ කළ මනා ශාරීරික ස්වස්ථතාවයකින් හෙබි පුද්ගලයකු නර්තනය කලාව තුළින් නිසැකවම බිහිවෙයි.

## කාර්ය පත්‍රිකාව

➢ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

01.ස්වස්ථතාව හා බැඳේ.

1.කායික, චිත්තවේගික, ආගමික, භාෂාමය 2. නිරෝගිකම, ආතතිය, පීඩනය, දරාගැනීම

3. කායික, මානසික, සාමාජීය, ආධ්‍යාත්මික 4. ශාරිරික, මානසික, චිත්තවේගික, හික්මවීම

02. ස්වස්ථතාව කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක වන්නේ

1.පාරසරික සාධක හා ශාරිරික සාධක 2. ආගමික සාධක හා කායික සාධක

3. කායික සාධක හා මානසික සාධක 4. චිත්තවේගික සාධක හා භාෂාමය සාධක

03.යහපත් මානසික ස්වස්ථතාවකට බලපාන කරුණක් වන්නේ

1.පිළිනොගැනීම හා ප්‍රතික්ශේප කිරීම 2.අඬදබර හා ආරවුල්

3.අධික වැඩ හා පීඩනය 4.ආදරය හා රැකවරණය

04. යහපත් මානසික ස්වස්ථතාවක් ඇති පුද්ගලයකු තුළින් ප්‍රදර්ශනය වන ලක්ෂණයක් වන්නේ

1.ඇහුන්කන් දීම හා පිළිගැනීම 2.විවේචනය හා නෙරපීම

3.ප්‍රචණ්ඩකාරි බව හා මතවාද 4.කළබලකාරි බව හා අවුල් සහගත බව

➢ යා කරන්න.

| | |
|---|---|
| 1.ඉන්ද්‍රිය සමායෝජනය | නම්‍යතාවය |
| 2. මානසික ස්වස්ථතාව | රස විඳීම |
| 3. කායික ස්වස්ථතාව | ස්වයං හික්මීම |
| 4.නිර්මාණශීලිත්වය | ලෙඩ රෝග වලින් තොර වීම |

➢ පිළිතුරු ලියන්න

1. ස්වස්ථතාව යන්න කෙටියෙන් පහදන්න.
2. .ශාරිරික ස්වස්ථතාව කෙරෙහි බලපාන මානසික සාධක තුනක් ලියා එකක් පිළිබඳ විස්තර කරන්න.
3. ශාරිරික ස්වස්ථතාව කෙරෙහි බලපාන කායික සාධක තුනක් ලියා එකක් පිළිබඳ විස්තර කරන්න.
4. කායික ස්වස්ථතාව සඳහා නර්තන කලාව තුළින් ලැබෙන දායකත්වය කෙබඳුද?
5. මානසික ස්වස්ථතාව සඳහා නර්තන කලාව තුළින් ලැබෙන දායකත්වය කෙබඳුද?
6. නර්තන කලාව තුළින් ලැබෙන ඉන්ද්‍රිය සමායෝජනය යහපත් කායික ස්වස්ථතාවක් සඳහා බලපාන්නේ කෙසේ දැයි විස්තර කරන්න.
7. .රස වින්දන කලාවක් ලෙසින් නර්තන කලාව මානසික ආතතීන් සමනය කිරීමට යොදා ගනි .මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.
8. නර්තනය හා ශාරීරික ස්වස්ථතාවය යන මාතෘකාව යටතේ පාසල් දැන්වීම් පුවරුවට ලිපියක් ලියන්න.
9. නර්තනය ස්වස්ථතාවයේ පුළුල් පැතිකඩක් වියෝජනය කරයි. විමසන්න.
10. යහපත් ශාරීරික ස්වස්ථතාවයක් සඳහා නර්තනය කලාව තුළ ඔබ අනුගමනය කල යුතු සාරධර්ම හා වත් පිළිවෙත් මොනවාද?

| නර්තනය | | |
|---|---|---|
| 9 ශ්‍රේණිය | 1 වාරය | |
| ගුරුභවතාගේ නම: ඩබ්ලිව්.සුරංගා කසුන්මාලි | | අම්/පාදාගොඩ විද්‍යාලය |

නිපුණතාව 3.0 : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.
නිපුණතා මට්ටම 3.1 : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.



## ගැට බෙරය

උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස ගැටබෙරය හැඳින්විය හැකිය. මැදින් ගැටයක් සේ පෙනෙන බැවින් මෙසේ හැඳින්වේ. මෙම බෙරය අතින් පමණක් වාදනය කරන බැවින් පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වර්ගීකරණයේ ආතත ගණයෙහි ලා සැලකේ.

බෙරයෙන් වාදනය වන බීජාක්ෂර සතර **තත්, ජිත්, තොං, නං** වේ. තත්, තොං අක්ෂර බෙරයේ වම් පසින් ද ජිත්, නං අක්ෂර දකුණු පසින් ද වාදනය කිරීම සාම්ප්‍රදායික ක්‍රමයයි. බෙර වාදනයේ දී ධ්වනි ගුණය ආරක්ෂා කිරීම සඳහා වාදන විධි ක්‍රම වැදගත් වේ.අක්ෂර භාවිතයේ දී ඒ ඒ ධ්වනි ගුණය ආරක්ෂා කිරීමට තම අත්ල නිවැරදි ක්‍රමවේදයන්ට අනුව භාවිත කළ යුතුය.එහිදී එක් එක් අක්ෂර උපදවා ගැනීමට බෙර ඇස තුළ හස්ත ස්ථානගත කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ. ඒ මඟින් ධ්වනි ගුණයේ විවිධතා මතු කර ගැනීමට හැකි වනු ඇත.

බෙර කඳ සඳහා අරටු සහිත ශක්තිමත් කඳන් වන ඇහැළ, කොහොඹ, කොස්, ගංසූරිය



සාම්ප්‍රදායික මිනුම් ක්‍රම අනුව බෙරයෙහි දිග තුන්වියත් තුනඟුලකි. (අඟල් 27ක් පමණ) බෙරයේ මුහුණතෙහි විශ්කම්භය විග්ගුස්සකි. (අඟල් 7-8ක් පමණ) මෙය වාදකයාගේ අත මිට මොළවා මහපටැඟිල්ල හා දබරැඟිල්ල දිගු කිරීමෙන් ලැබෙන දිගට සමාන ය.


බෙරයේ දෙපස වම් ඇස හා දකුණු ඇස වශයෙන් හඳුන්වන අතර වම් ඇසට හරක් හම හෝ මුව හම ද දකුණු ඇසට වඳුරු හම එළු හම හෝ තලගොයි හම

## ගැටබෙර වාදන අවස්ථා

ආගමික අවස්ථා: පිරිත් පින්කම්, පෙරහැර, තේවා වාදන අවස්ථා

සමාජීය අවස්ථා: ශාන්තිකර්ම, උත්සව, සමාරම්භක අවස්ථා, සන්දර්ශන, තූර්යවාදන

## ගැටබෙරයේ කොටස්




| | |
|---|---|
| 01 - බෙර ලනුව | 07 - බෙර කඳ |
| 02 - කයිපුඩි වළල්ල | 08 - කැපුම් හම |
| 03 - දකුණු ඇස | 09 - වම් ඇස |
| 04 - වෙනිවර කැරැල්ල | 10 - කන්වරය |
| 05 - වරපට | 11 - බෙර පුහුල |
| 06 - බොරදම් | 12 - සුරත් තට්ටුව |

**කාර්ය පත්‍රිකාව**

➢ නිවැරදි පිළිතුර තෝරන්න.

(01) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වන්නේ,

(1) යක්බෙරය (2) දවුල

(3) තම්මැට්ටම (4) ගැටබෙරය

(02) පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයේ ගැටබෙරය හඳුන්වනු ලබන්නේ,

(1) විතත (2) ආතත

(3) විතතාතත (4) ඝන

(03) බෙරයෙ හි දිග ප්‍රමාණය වන්නේ,

(1) දෙවියත් තුන්ඟුලකි (2) තුන්වියත් දැඟුලකි

(3) තුන්වියත් තුන්ඟුලකි (4) තුන්වියත් සිව්ඟුලකි

(04) සුරත් තට්ටුව ඇත්තේ කුමන වාද්‍ය භාණ්ඩයේ ද? ,

(1) ගැටබෙරය (2) තම්මැට්ටම

(3) පහතරට බෙරය (4) රබාන

(05) ගැටබෙරයේ දකුණු බෙර ඇසට යොදා ගනු නොලබන්නේ,

(1) හරක් හම (2) වඳුරු හම

(3) එළු හම (4) තලගොයි හම

➢ හිස්තැන් පුරවන්න.

(01) බීජාක්ෂර වැයීමේ දී ජිත්,නං අක්ෂර වාදනය කරන්නේ බෙරයේ ……………………. නි.

(02) බෙරය සෑදීමේ දී යොදා ගනු ලබන ලී වර්ග ගනු ලබන්නේ ..................................... ගස්වලිනි.

(03) බෙරයේ මුහුණතෙහි විශ්කම්භය..................................... කි.

(04) බෙරයේ කඳ මැදින් ගැටයක ස්වරූපයෙන් ඇති බැවින් .........................ලෙස හඳුන්වනු ලැබේ.

(05) බෙරයේ වම් බෙර ඇසට යොදා ගනු ලබන්නේ ............................ වැනි සම් වර්ග යි.

➢ නිවැරදි පිළිතුරු සපයන්න.

(01) බෙර කඳ සඳහා යොදා ගන්නා ලී වර්ග 04ක් නම් කරන්න.

(02) බෙර ඇස් සඳහා යොදා ගන්නා සම් වර්ග වෙන වෙනම නම් කරන්න.

(03) සතර බීජාක්ෂර වාදනය පිළිබඳ විස්තර කරන්න.

(04) ගැටබෙර වාදන අවස්ථා නම් කරන්න.

(05) ගැටබෙරයක රූප සටහනක් ඇඳ නම් කරන්න.

**නර්තනය**

| | | |
|---|---|---|
| 9 ශ්‍රේණිය | II වාරය | |
| ගුරුභවතාගේ නම : Y.G.U.S. රාජපක්ෂ | පාසල | අම්/ සද්ධාතිස්ස ජාතික පාසල |

නිපුණතාව : 1.3 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම : 1.3.1 ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂී ලක්ෂණ හඳුනා ගනිමින් නර්තන නිර්මාණය කරයි.

## පන් / ගොයම් නර්තන අංග හා බැඳි සුවිශේෂී ලක්ෂණ හඳුනා ගනිමු .

## පන් නෙලීමේ නර්තනය

දේශීය ගැමි නර්තන අතුරින් ජීවන වෘත්තියක් මුල් කොට ගෙන නිර්මාණය වූ නර්තන අංගයක් ලෙස පන් නෙලීම හැඳින්වේ. මෙකී නර්තනය ප්‍රථම වරට වේදිකාවට ගෙන ඒමේ ගෞරවය හිමි වන්නේ එස්.පණිභාරත මහතාටය.

පන් ආශ්‍රිත නිර්මාණයන්ට මූලික තැනක් ලබා දෙමින් එම ක්‍රියාකාරකම් නර්තන අනුසාරයෙන් රඟදැක්වීම මෙහි සුවිශේෂත්වයකි. "පන් පැදුර" ශාන්ති කර්ම වලදී මෙන්ම ගැමි නාටක වලදී රංග භාණ්ඩයක් වශයෙන්ද භාවිතා කර ඇත.



පන් නර්තනයට උචිත පරිදි නිර්මාණය වී ඇති කවි ගායනා තුලින් පන් නර්තනයේ ඉරියව් භාවිතය මෙන්ම කාන්තාවන් පන් නෙලීමට යාමට සැරසෙන ආකාරය , පන් ගෙනවිත් වේලා , " පන් පතුරෙන් " පන් ගස් මැද , සායම් යොදා වර්ණ ගන්වා රටා දමා පැදුර වියන ආකාරයද නිරූපණය කෙරේ. මෙය විනෝදාස්වාදය මුල් කරගත් නර්තනයකි.

## පන් නෙළිමේදී නර්තනයක් නිර්මාණයේදී අවධානය යොමු කල යුතු කරුණු.



- පන් නෙළිමේ ක්‍රියාවලිය ඉස්මතු වන පරිදි චලන නිර්මාණය කිරීම.
- සාමූහික නර්තනයක් බැවින් ඒ සඳහා මූලිකත්වය ලබා දීම
- නැටුමට උචිත සරල පද නිර්මාණය කිරීම.
- හැඩ තල රංග රටා මෝස්තර භාවිතය
- පන් කැපීමට ගන්නා උපකරණ, පන් ආශ්‍රිත නිර්මාණ නර්තනයට එක් කර ගැනීම.

## ගොයම් නැටුම

වී ගොවිතැන ඇසුරු කර ගනිමින් දේශිය ගැමි නැටුම් කිහිපයක් නිර්මාණය වී ඇත. ගොයම් නෙළුම් , ගොයම් කැපීම , ගොවි නැටුම මේ අතර ප්‍රධාන වේ. ගොයම් නෙළුම් නර්තනයේදී ගොයම් පැල සිටුවීමත් (නෙළුම් ගී ආශ්‍රිතව සිදුකෙරේ) ගොවි නැටුමේදී සී සෑමේ සිට අස්වනු නෙලා ගෙට ගැනීම දක්වා වූ සමස්ත කාර්යය එහිදී නර්තනය මගින් ගෙන හැර දක්වයි.

ගොයම් කැපීමේ නර්තනයේදී අස්වනු නෙළීම නැතහොත් ගොයම් කැපීමේ අවස්ථා පදනම් කොට ගෙන නිර්මාණය වී ඇත. අප අධ්‍යනය කරනුයේ ගොයම් කැපීමේ නර්තනයයි.

ගොයම් කැපීමට අවසර ගැනීම , ගොයම් කැපීම , ගොයම් මිටි බැඳීම , රැගෙන යාම , ඇඹුල ගෙන ඒම ආදි කොට ඇති අවස්ථා රාශියක් මෙකී නර්තනයෙන් ඉදිරිපත් කරනු ලැබේ.

මෙම නර්තනය ප්‍රාසාංගික නර්තන අංගයක් ලෙස ප්‍රථම වරට නිර්මාණය කොට ඉදිරිපත් කරන ලද්දේ ශ්‍රී ලංකාවේ ප්‍රකට නර්තන ශිල්පියෙකු සහ මුද්‍රා නාට්‍ය නිර්මාණ ශිල්පියෙකු වන ආචාර්යය එස්. පණිභාරත මහතා විසිනි. කෙසේ වෙතත් අද්‍යතනය වන විට මෙම නර්තන අංගය නොයෙක් ප්‍රතිනිර්මාණයන්ට භාජනය වෙමින් වත්මන් තත්වයේ පවතී.





### ගොයම් කැපීමේ නර්තන නිර්මාණයක දී අවධානය යොමු කල යුතු කරුණු.

- සුවිශේෂී ලක්ෂණ ඉස්මතු වන පරිදි උචිත චලන භාවිතය.
- ගොයම් කැපීමට උචිත පරිදි සරල චලන නිර්මාණ කිරීම.
- දෑකැත්ත නිවැරදිව හසුරවීම හා ගොයම් කැපීමේ ක්‍රියාවලිය නිවැරදිව නිරූපණය කිරීම.
- හැඩතල රංග රටා භාවිතය පිළිබඳ අවබෝධය
- සාමූහික නර්තනයක් බැවින් චලන භාවිතයේදී සැලකිලිමත් වීම.

<u>කාර්ය පත්‍රිකාව</u>

➢ **පහත වාක්‍ය කියවා හරිනම් (✓) ලකුණද , වැරදි නම් (×) ලකුණද යොදන්න.**

1. පන් නෙලීමේ නර්තනය සාමූහික නර්තන අංගයකි. ( )
2. ගොයම් නර්තනය සඳහා සංකීර්ණ චලන යොදා ගැනීම යෝග්‍ය වේ. ( )
3. ගොයම් නැටුම් කේ. ඇස්. ප්‍රනාන්දු මහතාගේ නිර්මාණයකි. ( )
4. පන් නෙළීමේ නර්තනය විනෝදාස්වාදය මුල් කොට ගෙන නිර්මාණය වී ඇත. ( )
5. පන් ගස් පිරිමැදීම අත්ලෙන් සිදු කෙරේ. ( )

➢ **පහත වාක්‍ය කියවා හිස්තැන් පුරවන්න.**

(1) ...................................... කවි ශාන්ති කර්මයේදී අසන්නට ලැබේ.

(2) ගොයම් නෙලීමේදී ................................................ ගී ගයනු ලැබේ.

(3) ගොයම් නැටුමේ නිර්මාතෘ .................................................... මහතාය.

(4) ........................................... නම් උපකරණය මගින් පන්ගස් මදිනු ලැබේ.

(5) ........................................... , ....................... ගොයම් කැපීමේ විවිධ අවස්ථාවන් වේ.

➢ **පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01. ගොයම් කැපීමේ සුවිශේෂි ලක්ෂණ 03ක් දක්වන්න.

02. ගොයම් නැටුම පිළිබඳ කරුණු දක්වන්න.

03. පන් නෙළිමේ නැටුමේ සුවිශේෂි ලක්ෂණ 03ක් ලියන්න.

04. පන් නැටුම් හා ගොයම් නැටුම් නිර්මාණය කල ප්‍රවීණ නර්තන ශිල්පියා නම් කරන්න.

05. ඔබ කැමති ගොයම් / පන් කවියක් ලියන්න.

| නර්තනය | | |
|---|---|---|
| 6 ශ්‍රේණිය | 11 වාරය | |
| ගුරුභවතාගේ නම : ඒ.වී.එස්.සී.ගුණසේකර | | අම්/අඹගහවැල්ල මහා විද්‍යාලය |

නිපුණතාවය : 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශණය කරයි.

නිපුණතා මට්ටම : 3.2 විධික්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි.

## සතර බීජාක්ෂර හා සරඹ පද වාදනය

සතර බීජාක්ෂර හා සරඹ පද වාදනය උඩරට පහතරට සබරගමු යන නර්තන සාම්ප්‍රදායන් තුනෙහිම බෙර පද දවුල් පද නිර්මාණය වි ඇත්තේ බීජාක්ෂර මුල් කර ගනිමිනි. පොදු වූ ධ්වනි හතරකි. එය බීජාක්ෂර ලෙස හැඳින්වෙන අතර ඒවා පදනම් කරගෙන උපදින අනෙකුත් අක්ෂර ගර්භාක්ෂර ලෙස හැඳින්වේ.

**උඩරට නර්තන සම්ප්‍රදාය - තත් , ජිත්, තොං, නං**

**පහතරට නර්තන සම්ප්‍රදාය - තත් ,දිත් , තොං ,නං**

**සබරගමු නර්තන සම්ප්‍රදාය - තත් ,ජිත් ,තොං , නං**

## සතර බීජාක්ෂර වාදනය වන ආකාරය




තත් - බෙරයේ වම් ඇසට ඇඟිලි පුපුරා යන සේ ගසයි

ජිත් - බෙරයේ දකුණු ඇසට පුපුරා යන සේ ගසයි.

තොං - බෙරයේ වම් ඇසේ ගැටියට සුළැඟිලි ප්‍රදේශයෙන් ගසයි.

නං - බෙරයේ දකුණු ඇසේ ගැටියට සුළැඟිලි ප්‍රදේශයෙන් ගසයි.

❖ සතර බීජාක්ෂර වලට අමතරව අනෙකුත් අක්ෂරයන් (ගර්භාක්ෂර) වාදනය වන අයුරු දැනගත යුතු වේ.

- ගැට බෙරයේ වම් ඇස මුල් කරගෙන වාදනය වන අක්ෂර

  **ගත්, ත, ග, තා**

- ගැට බෙරයේ දකුණු ඇසින් උපදවා ගත හැකි අක්ෂර

  **ජිං, දං, තං, නං**

❖ සතර බීජාක්ෂර මුල් කරගත් සරඹ පද උඩරට නර්තන සම්ප්‍රදාය

**තත්කඩ ජික්කඩ තොංකඩ නංකඩ**

❖ උඩරට බෙර සරඹ - **තකට**

**තකට කුදට**

**තකට තකට කුද**

❖ මැදුම් තනි තිතට බෙර පද- **ජිං ගත ගො ගො**

<u>බෙර වාදනය හා බැඳී චාරිත්‍ර</u>

- පූජනීය වස්තුවක් ලෙස ගෞරව කිරීම.
- බෙර වාදනයට පෙර හා පසු නමස්කාර කිරීම
- .වැටීමට පෙරලීමට නොවනසේ ආරක්ෂා කර පරිහරණය කල යුතුයි.
- .බෙරය මතින් පැනීම හෝ ඉන බැඳි බෙරය පා යටින් ගැලවීම නොකල යුතුයි.

## <u>කාර්ය පත්‍රිකාව</u>

➢ හිස්තැන් පුරවන්න.

1. ගැට බෙරයේ උපදින මූලික බීජාක්ෂර වනුයේ ...............................................නම් වේ.
2. වම් ඇස මැදට හඩ විහිදෙන ලෙස පුපුරා ගැසීමෙන් නිකුත් වන්නේ............ .......ශබ්දයයි.
3. තොං යන බීජාක්ෂරය ගැටබෙරයේ ................. ඇසේ ගැටිය අසලට. ......................... ගැසිමෙන් නිකුත් වේ.
4. දකුණු ඇසේ ගැටිය ඉහළට අත පුපුරා ගැසීමෙන් .................... ශබ්දය නිකුත් වේ.
5. නං ශබ්දය නිකුත් වන්නේ..............ඇසේ ගැටිය අසලට ................ප්‍රදේශයෙන් ගැසීමෙනි.

➢ පිළිතුරු ලියන්න.

1.සතර බීජාක්ෂර යනු කුමක්දැයි විස්තර කරන්න.

2.ගර් භාක්ෂර 05ක් නම් කරන්න.

3.සතර බීජාක්ෂර මුල් වූ සරඹ පද වෙන වෙනම ලියන්න.

4.මාත්‍රා දෙකේ තාලයට බෙර පදයක් ලියන්න.

5.බෙර සරඹ ලියන්න

6.මාත්‍රා 3තාලයට වාදනය කල හැකි බෙර පදයක් ලියන්න.

| නර්තනය | | |
|---|---|---|
| 9 ශ්‍රේණිය | 11 වාරය | |
| ගුරුභවතාගේ නම : ඊ. පී. සවනි දිනේශිකා | | අම් / උක්සිරිපුර විද්‍යාලය |

නිපුණතාවය : 2.0 නර්තන හා සබැඳි මුලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 2.5 නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය

## වන්නම්

වන්නම් යනුවෙන් හැඳින්වෙන ශාස්ත්‍රීය නර්තන වෙසෙස උඩරට පහතරට සබරගමු යන සම්ප්‍රදායන් තුනෙහිම දක්නට ඇත. වන්නම් යන්නෙන් අදහස් කරන්නේ යමක් පිළිබඳ වර්ණනා කිරීමකි. නැතහොත් විස්තර කිරීමකි. මුල් යුගයේ වන්නම් රචනා කරන ලද්දේ ගායනය සඳහාය. නර්තනය පසු කලෙක එකතු වී ඇත. ගායනයත් සමඟ නර්තනය_යොදාගනු ලබන වන්නම් නර්තනය ශාස්ත්‍රීය සබ නැටුම් වෙසෙසක් බවට පරිවර්තනය විය.

උඩරට නර්තන සම්ප්‍රදායට අයත් සම්ප්‍රදායික වන්නම් සංඛ්‍යාව 18කි. මීට අමතරව අප්‍රකට වන්නම් ගණනාවක්ද ඇත. වන්නම් 18 රචනා කරන ලද්දේ බමුණු පඬිවරයකු වන **ගණිතාලංකාර** නම් තැනැත්තා විසිනි. උඩරට වන්නම් සතුන්, සිද්ධි හෝ යම් අවස්ථාවක් , වස්තුවක් පිළිබඳ වර්ණනා කිරීමක් සිදු කරයි. වන්නම් 18 එකම අකෘතියකින් යුක්තය. එකී අකෘතිය නම් **බෙර පදය , තානම , කවිය , කස්තිරම ,සිරුමාරුව , අඩව්ව** යන කොටස් 6න් සමන්විතයි. උඩරට වන්නම් විනෝදාස්වාදය අරමුණු කොට පවත්වයි. උඩරට වන්නම් මහනුවර යුගයේදී රාජකීයන්ගේ හා වෙනත් ප්‍රභූන්ගේ විනෝදාස්වාදය සඳහා කවිකාර මඩුවේ ගායනා කල බව පවසයි. දහඅට වන්නම් යන පරිභාෂිත ව්‍යවහාරයෙන් හැඳින්වෙයි.

පහතරට වන්නම් සංඛ්‍යාව 32 කි. සින්දු වන්නම් ලෙස හඳුන්වයි. සින්දු වන්නම් වල මුලික අරමුණ පූජාර්ථයයි. වන්නම් ගායනයෙන් කියවෙන්නේ දේව වර්ණනාවකි. සින්දු වන්නමක අකෘතිය කොටස් 4කින් යුක්තය**. බෙරපදය තානම කවිය ඉරට්ටිය** වේ.

සබරගමු වන්නම් 21 කි. සබරගමු වන්නමක අකෘතිය ප්‍රධාන කොටස් 5කින් යුක්තය . **දවුල් පදය , තානම , කවිය , කලාසම , අඩව්ව** වේ. සබරගමු වන්නම් අතරින් ඇතැම් ඒවා වාද ගී ස්වරූපයෙන් රචනා වී ඇති බව පෙනේ. වාද ගී ගැයීමද විනෝදාස්වාද සඳහා කරන්නකි.

## වෛරොඬි වන්නම

උඩරට වන්නම් 18 ට අයත් වන්නම් අතරින් වෛරොඬි වන්නම කස්තිරම දක්වා 8 ශ්‍රේණියේදී නර්තනය කර ඇත. එයට අදාළ සීරුමාරුව හා අඩව්ව සමඟ වන්නම සම්පූර්ණයෙන් නර්තනය කරමු.




**සීරුමාරුව** - තකට දොදොං තා කුංදත් තරිකිට
තකට දොදොං තා

**අඩව්ව** - ගත්ත තෙහිඟු තකට තකුඳ
තක්කඩ ජික්කඩ කඩතක තකට තකුඳ
ගතකු තෙහිඟු තකට තකුඳ
තත් - තක්කඩ තරිකිට ජිත් - ජික්කඩ තරිකිට
තොං - තොංකඩ තරිකිට නං

- 9 ශ්‍රේණියේ පළමු වාරයට නියමිත සිංහරාජ වන්නම ගායනය හා දෙවන වාරයට නියමිත සිංහරාජ වන්නම නර්තනය කරමු.

## සිංහරාජ වන්නම



ගැමි සමාජයේ ප්‍රචලිත ජන කතාවක් ඇසුරුකර ගනිමින් රචනා කර ඇති උපදේශාත්මක ලක්ෂණයන්ගෙන් යුක්ත වන්නමකි. පෙර කලෙක ඉබ්බෙකු විසින් වනයේ සිටි සිංහයා රවටන ලද ආකාරය පසුබිම් කොට ගනිමින් දුර දිග නොබලා වැඩ කිරීමෙන් කවරෙකු වුවද විපතට පත්විය. හැකි බවත් දුර දිග බලා විමසිලිමත් බවින් කටයුතු කිරීම මගින් තමන්ට යහපතක් සිදුවන බවත් මෙම වන්නමෙහි අන්තර්ගතයෙන් පැහැදිලි වේ. මාත්‍රා 4+4 තනි තිතට අයත් වන්නමකි. ගායනයේදී අවග්‍රහයෙන් (තිත වැදීමෙන් පසු ) ගායනය කෙරේ. ගායනයේදී මෙන්ම නර්තනයේදී ලය පාලනය කරගත යුතුය.

## සිංහරාජ වන්නම

**තාලය** - මහතනිතිත (1234 /1234)

**බෙර පදය** - දො දොංත තකු දොං

**තානම** - තනත් තනෙන තම්- දනත් තනෙන තම් දනත් තනෙන තම් දන තානා .......තන

තනත් තනෙන තම්- දනත් තනෙන තම් දනත් තනෙන තම් දන තානා ..........

**කවිය** - පෙරත් කලෙක සිහ රජෙක් වැටුණි මහ ළිදක් තුළක ඉබි ලඩෙක් කරපු වැඩ

ඇරත් මෙහෙම යස වැඩක් උණේ නැත විරත් කලෙක පැවතුමක් යසයි හැඩ

දුරත් බැලුම නොව ළගත් බලන අය හටත් මෙලෙස වෙයි කැටත් .තබම් දඩ

වටත් අයට දැනෙ නටත් කියමි මම රටක් වටින සිංහ රජ වන්නමෙ හැඩ

**කස්තිරම** - තකට තකට තක තරිකිට කුංදත් ///

රුංතක ජිංතක ජිංතක ජිං කුඳ ///

තාග් ගජිංතක තරිකිට කුංදත් //

රුංතක ජිංතක තරිකිට කුංදත් තා



## කාර්ය පත්‍රිකාව

- වගුව සම්පූර්ණ කරන්න

| වන්නම | තිත | බෙරපදය |
|---|---|---|
| හනුමා වන්නම | | |
| තුරගා වන්නම | | |
| වෛරොඩි වන්නම | | |
| සිංහරාජ වන්නම | | |

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

1. සිංහයෙකු පිළිබඳ කියවෙන වන්නමකි.

   i හනුමා වන්නම ii තුරඟා වන්නම iii වෛරොඩි වන්නම iv සිංහරාජ වන්නම

2. තකට දොදොං තා කුංදත් තරිකිට මෙම පද කොටස අයත් වන්නේ

   i කස්තිරමට iiසීරුමාරුවට iii තානම iv අඩව්වට

3. හටත් ..............වෙයි කැටත් යන කවි පදයේ හිස් තැනට සුදුසු වචනය.

   i මෙලෙස ii බලන iii බැලුම iv මෙහෙම

4. පහතරට වන්නමක කොටස්

   i 3 යි. ii 4යි. ii 6 යි. iv 5යි.

5. ගණිතාලංකාර පඬිවරයා විසින් රචනා කරන ලද්දේ

   i වාද ගීත ii ගැමි නැටුම් iii උඩරට වන්නම් iv සබරගමු වන්නම්

6. වන්නම් නර්තනයේදී යොදා ගනු ලබන චලන වනුයේ

   i ප්‍රකාශනාත්මක චලන ii රිද්මානුකූල චලන iii තාලානුකූල චලන iv අභිචලන

7. සෙත් ශාන්තියක් මුල් කරගෙන රචනා වී ඇත්තේ

   i උඩරට වන්නම් ii පහතරට වන්නම් iii සබරගමු වන්නම් iv ගැමි නැටුම්

8. උඩරට වන්නම් වල දැකිය නොහැක්කේ

   i සත්ත්ව චරිත ii දේව චරිත iii යක්ෂ චරිත iv සිද්ධි හා වස්තු

9. උඩරට වන්නම් නර්තනයේදී අවසානයට නටනුයේ

   i කස්තිරම ii අඩව්ව ii සීරුමාරුව iv තානම

10. සබරගමු වන්නමකට පමණක් අයත් කොටසකි.

    i කලාසම ii අඩව්ව iii කවිය iv තානම

11. උඩරට වන්නම් මුල් යුගයේ රචනා වුයේ

    i පෙරහැර සඳහා ii රාජකීයන්ගේ විනෝදය සඳහා iiiරජුන් සඳහා iv ඇමතිවරු සඳහා

12. .මැදුම් තනි තිතට වාදනය කල හැකි බෙර පදයකි.
    i කුද ගත ගත දොම් ii ජිංගත ගො ගො iii දොං ජිංත ගත දොංත iv දොදොංත තකු දොං

**නර්තනය**

9 ශ්‍රේණිය　　II වාරය

ගුරුවරයාගේ නම :H.M. නදීකා ශිරෝමි　　අම්/ සේනාගම මහා විද්‍යාලය

නිපුණතාව :5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම : 5.1 ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම විස්තර කරයි.


## ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සම්බන්ධ මූලාශ්‍රය හඳුනා ගනිමු.

## (සෙල්ලිපි, සන්දේශ කාව්‍ය)


ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු ගවේෂණයේ දී උපයෝගී කර ගත හැකි මූලාශ්‍රය වර්ග කිහිපයක් යටතේ සාකච්ඡා කළ හැකිය.


- වංශ කතා.
- රූකම්.
- සෙල්ලිපි.
- සංදේශ කාව්‍ය.
- සාහිත්‍ය කෘති.
- දේශ සංචාරකයින්ගේ වාර්තා.

ශ්‍රී ලාංකේය නර්තන කලා ඉතිහාසය පිලිබඳ තොරතුරු මූලාශ්‍ර වශයෙන් ගෙන විමසීම වඩාත් වැදගත් වේ.







ඉහත සඳහන් මූලාශ්‍ර යටතේ සෙල්ලිපි සංදේශ කාව්‍ය ඇසුරෙන් නර්තන කලාව පැවති බවට සාධක.

- යුගය - අනුරාධපුරය
- මූලාශ්‍රය - සෙල්ලිපි / ලෙන් ලිපි.

සාධකය

- ක්‍රි : ව: 1-2 සියවස් වලට අයත් සැස්සේරුව සෙල්ලිපියේ **" නටන ගහ පතියා විසින් පවරා දෙන ලදී..."** යනුවෙන් සඳහන් වේ.

- කොරවක්ගල ලෙන් ලිපිය. **නටන ගහපතියාගේ දූව විසින් පවරා දෙන ලදී..".** යනුවෙන් සඳහන් වේ. මෙහි **"ගහපතියා"** යනුවෙන් දැක්වෙන්නේ නැටුම් පරම්පරාවක් සිටි බවයි.



- යුගය - පොළොන්නරුව.
- මූලාශ්‍රය - පාලමොට්ටායි සෙල්ලිපිය.

සාධකය


- මෙම ශිලා ලිපිය අනුව දේවදාසින් සිටි බවත්, නැටූ බවත් ,ලංකාව සොළීන්ට යටත් වූ පසුව මෙවැනි ආකාරයට දෙවියන් උදෙසා පූජා පැවැත්වීම ආරම්භ කළ බවත් කියවේ. මෙම ලිපියට අනුව නළලේ සලකුණු තබා දේවදාසින් හත්දෙනකු පිදූ බවත්, ඔවුන්ට තැන්පත් කළ මුදලක පොලියෙන් කාසි ගෙවූ බවත් කියවේ..
- **"කාලිංග වනයෙහි නෘත්‍ය ගීත බලා වැඩ හිඳිනා සිංහාසන යයි "**, යනුවෙන් කාලිංග වනෝද්‍යානයේ ගල් ආසන ලිපියේ සඳහන් වේ.





- යුගය - ගම්පොල.
- මූලාශ්‍රය - සංදේශ කාව්‍ය.
- සාධකය - තිසර සංදේශය.


❖ තිසර සංදේශ කාව්‍ය 19 වන සියවසේ ලියන ලද බව පිළිගැනේ. මෙහි වාද්‍ය භාණ්ඩ හා නර්තන අංග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.



තහලම් තල බෙර තම්මැට පට තන්තිරි ඩමුරු
තඹ මේ ඩැක බෙර බොම්බිලි වීණා මිණි සිසිරු
බෙර මද්දල කහලම් රසු නිගළම් බඳ සොඳුරු
මෙසියල් මහා ගිගුමෙන් පළ කෙරෙමින් සිදු අයුරු

නිලුපුල් දිගැසි තනරණ කලසි
විදුලිය සදිසි සියුමැලි දිගැසි
රඟ බැස නොලැසී රඟදෙන විලසි
දුටු එම විගසී මද තෙම ඇවිසී


- යුගය - කෝට්ටේ.
- මූලාශ්‍රය - සංදේශ කාව්‍ය.
- සාධකය - සැළලිහිණි සංදේශය



විදෙන ලෙලෙන නරු බර පුළුලුකුල රැඳී
හෙළන නඟන අත නුවනග බැලුම් දිදී
රුවන දිලෙන අබරණ කැලුම ගත යෙදී
සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැදී

ලකල පුළුලුකුළ බැඳි මිණි මෙවුල්ලා
සමග රන් සලඹ රැවු දී වෙවුල්ලා
වයන පදට තබමින් පද කමල්ලා
රඟන ළඳුන් බල රූ සිරි සියල්ලා

**පරවි සංදේශය**



ලෙළඳුන් නව තඹ පලු වන් පාදේ.
තබමින් නිවරද මද්දල නාදේ
ගයමින් පානා ගීයෙන් කී දේ
අඟනන් රඟ දුටුවන් සිතු පැදේ

ලෙලළෙනා දිගු නෙත නිලුපුල සේයා
ලෙළ පවනින් රන් ලිය විලසේයා
නළඟන රගනා දැක නොලසේයා
නළඟන නුවනත රඟ සැලැසේයා

# කාර්ය පත්‍රිකාව

➢ නිවැරදි පිළිතුර යටින් ඉරක් අදින්න

1. නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු ඇතුළත් මූලාශ්‍රයක් නොවන්නේ

   1. වංශකතා 2. භාරතීය සම්භවය 3. රූකම් 4.සෙල්ලිපි

2. ක්‍රි 2-1 .ව.සියවස් වලට අයත් සෙල්ලිපිය වන්නේ

   1. සැස්සේරුව සෙල් ලිපිය 2. වංශ කතා සෙල්ලිපිය 3. මූර්ති 4. කැටයම්

3. සැස්සේරුව සෙල්ලිපියේ සඳහන් වන්නේ.

   1.නටන ගහපතියාගේ දුව විසින් පවරා දෙන ලදි 2. නර්තනය පැවති බව

   3. නටන ගහපතියා විසින් පවරා දෙන ලදි 4. පංචතූර්‍ය භාණ්ඩ පිළිබද

4. ''ගහපති'' යනු,

   1.නැටුම් පරම්පරාවක් සිටි බව 2. පංචතූර්‍ය වර්ගීකරණය

   3. නර්තනය ඉගැන්වූ බව 4. වාදනය ඉගැන්වූ බව

5. සැස්සේරුව සෙල් ලිපිය පිළිබද සදහන් යුගය වන්නේ

   1. පොළොන්නරු යුගය 2. දඹදෙණි යුගය

   3. කෝට්ටේ යුගය 4. අනුරාධපුර යුගය

6. පාලමොට්ටායි සෙල්ලිපිය පිළිබඳ සදහන් යුගය වන්නේ

   1. පොළොන්නරු යුගය 2. අනුරාධපුර යුගය

   3. කුරුනෑගල යුගය 4. මහනුවර යුගය

7. දේවදාසීන් සිටිබව සදහන් වන්නේ

   1. කොරවක් ගල ලෙන්ලිපිය 2. සැස්සේරුව සෙල්ලිපිය

   2. පාලමොට්ටායි සෙල්ලිපිය 4. ගිරිලිපිය

8. දේවදාසීන් ගනණින්

   1. 7කි. 2. 2කි. 3.10කි. 4.4කි.

➢ පිළිතුරු ලියන්න

01. 19 වන සියවසේ ලියන ලද සංදේශ කාව්‍ය ...................... වේ.

02. වාදන භාණ්ඩ හා නර්තන අංග පිළිබද තොරතුරු දැක්වෙන්නේ............................... නි.

03. නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබද තොරතුරු ඇතුලත් මූලාශ්‍ර මොනවාද?

04. කොරවක් ගල ලෙන් ලිපියේ සදහන් වන්නේ කුමක්ද?

05. පාලමොට්ටායි සෙල්ලිපියේ සදහන් වන්නේ කුමක්ද?

06. කාලිංග වනෝද්‍යානයේ ගල් ආසන ලිපියේ සදහන් වන තොරතුර ලියන්න.

07. නර්තන කලාව තිබූ බවට සදහන් සංදේශ කාව්‍ය මොනවාද? ඉන් සැළලිහිණි සංදේශයේ සදහන් එක් කවියක් ලියා දක්වන්න.

**නර්තනය**

9 ශ්‍රේණිය II වාරය

ගුරුභවතාගේ නම : එන්.ටී කරුණාගම ඩී.එස්. සේනානායක ජාතික

නිපුණතාව. : 7.0 විවිධ අත්දැකීම් ඇසුරු කර ගනිමින් කලා අංග නිර්මාණය කරයි

නිපුණතා මට්ටම. : 7.03 සරල රංග උපකරණයක් නිර්මාණය කරයි.

## <u>රංග උපකරණ නිර්මාණය</u>

රංග උපකරණයක් නිර්මාණය යනු,

- ගැමි ජන ජීවිතයේ දී භාවිතා කරන කළය, කුල්ල, දෑකැත්ත වැනි උපකරණ නර්තනයේදී භාවිත කරයි.
- එසේ යොදා ගන්නා උපකරණ නර්තනයේදී රංග උපකරණයක් නැතහොත් රංග භාණ්ඩයක් ලෙස හඳුන්වයි.
- ගැමි නර්තන අංග වලදී රංග උපකරණය සුවිශේෂී වේ.
- ජන ජීවිතයේ දෛනික ක්‍රියාකාරකම් රංග භූමියක් තුළ ප්‍රේක්ෂකයා වෙත තාත්විකව ඉදිරිපත් කිරීමට රංග උපකරණය වැදගත් වේ.

### <u>කුල්ල</u>

- සහල් පෙළීමට
- වී හුලං කිරීමට
- සහල් රැගෙන යෑමට වැනි ක්‍රියාවන් සඳහා කුල්ල භාවිත කරයි






කුල්ලෙහි ආකෘතියක් නිර්මාණය කිරීම සඳහා යොදා ගත හැකි අමුද්‍රව්‍ය,

- කොලපත්
- කාඩ්බෝඩ්
- බ්‍රිස්ටල් බෝඩ්
- වර්ණ කඩදාසි





### <u>දෑකැත්ත</u>




ගොයම් කැපීමට භාවිතා කරයි

දැකැත්තක ආකෘතියක් නිර්මාණය කිරීම සඳහා යොදා ගත හැකි අමුද්‍රව්‍යය,




- කාඩ්බෝඩ්
- හාර්ඩ්බෝඩ්
- බෙලෙක් තහඩු
- වර්ණ කඩදාසි
- PVC බට කැබැල්ලක්

මෝල් ගසක ආකෘතියක් නිර්මාණය සඳහා යොදාගත හැකි අමුද්‍රව්‍යය,

❖ එස්ලෝන් බට .වර්ණ කඩදාසි රෙදි ඔතන බම්බු

<u>මෝල් ගස</u>




වී ඇතුළු ධාන්‍ය වර්ග කෙටීම සඳහා භාවිතා කරයි.

මෝල් ගසක ආකෘතියක් නිර්මාණය සඳහා යොදාගත හැකි අමුද්‍රව්‍යය,

- එස්ලෝන් බට
- වර්ණ කඩදාසි
- රෙදි ඔතන බම්බු




<u>රංග උපකරණයක් නිර්මාණකිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු,</u>

- නිර්මාණය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍යය ස්වභාවික පරිසරයෙන් සකසා ගත් ඒවා විය යුතුය.
- නර්තන ක්‍රියාව පහසු කරවීම සඳහා සැහැල්ලු අමුද්‍රව්‍ය භාවිත කළ යුතුය.
- ආකෘතිය සැලසුම් කිරිම.
- අදාල රංග භාණ්ඩයේ බාහිර ස්වරූපය වෙනස් නොවන අයුරින් නිර්මාණය සැලසුම් කළ යුතුය

<u>**කාර්ය පත්‍රිකාව**</u>

1. රංග භාණ්ඩයක් ලෙස කුල්ලක් නිර්මාණය කිරීම සඳහා යොදා ගත හැකි අමුද්‍රව්‍යය දෙකක් සඳහන් කරන්න.
2. රංග භාණ්ඩයක් ලෙස කුල්ලක් නිර්මාණය කර ගත් පසු එහි අලංකාරය වැඩි කිරීම සඳහා ඔබ සිදුකරන ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න
3. මෝල් ගසක් රංග භාණ්ඩයක් ලෙස නිර්මාණය කිරීමේ දී ඔබ සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.
4. රංග භාණ්ඩයක් ලෙස දැකැත්තක් නිර්මාණය කිරීමේදී ඔබ එය නිර්මාණය කරන පියවර මොනවාදැයි කෙටියෙන් සඳහන් කරන්න.
5. රංග භාණ්ඩ නිර්මාණය කිරීම සඳහා ස්වභාවික අමුද්‍රව්‍යය සපයා ගැනීම යෝග්‍ය වන්නේ කුමන කරුණු නිසාදැයි සඳහන් කරන්න.

**නර්තනය**

9 ශ්‍රේණිය 11 වාරය

ගුරුභවතාගේ නම: ආර්.එම්.සී. රාජපක්ෂ කලාප අධ්‍යාපන කාර්යාලය, අම්පාර.

නිපුනතාව : 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කර ගනිමින් නර්තන නිර්මාණ කරයි.

නිපුණතා මට්ටම: 1.2 භාව ප්‍රකාශනය වන පරිදි චරිත නිරූපනය කරයි.

## ශෝකය නමැති ස්ථායිභාවය නිරූපනය කරමු.

අප අවට පරිසරය තුළ ජීවත්වන විවිධ පුද්ගලයන්ගේ හැසිරීම් පිළිබද ව හොඳින් නිරීක්ෂණය කිරීම මගින් විවිධ අත්දැකීම් ලබාගත හැකිය. පුද්ගලයන් අතර හැසිරීම් රටා , කථා විලාස, ගමන් රටා, හා ශරීර ස්වභායන්හි විවිධ වෙනස්කම් දක්නට ඇත. මේ අනුව තම තමන්ට ආවේණික විවිධ හැසිරීම් රටාවන් ඇති බව මින් අනාවරණය වේ.

මෙවැනි හැසිරීම් රටා ඇති චරිත නිරීක්ෂණය කිරීමට රස හා භාව පිළිබද අධ්‍යයනය කිරීම කළ යුතුයි. ශරීරය අංග,ප්‍රත්‍යාංග ,උපාංග යන ප්‍රධාන කොටස් තුළින් මිනිස් හැසිරීම් රටා උද්දීපනය කරයි. මීට පෙර ඔබ 8 ශ්‍රේණියේ දී ඉගෙන ගත් **‘ භය’** නමැති ස්ථායි භාවය මගින් භයානක රසය නිරූපණය කළ අයුරු මතකයට නගා ගන්න ඒ මතකය මගින් ශෝක භාවය පිළිබද විමසා බලමු.

### ශෝක භාවය උද්දීපනය වන්නා වූ අවස්ථා

සිත කම්පා කරන සිදුවීමක් දැකීම

එවැනි සිදුවීමක් අසන්නට ලැබීම

තමා සමග සමීප ව සිටි කෙනෙකු වියෝ වීම

ඇලුම්කල යම් දෙයක් අහිමිවීම

වධ හිංසාවටපත්වීම

ප්‍රියයන්ගෙන් වෙන්වීම.



මෙම අවස්ථාවන් මුල් කොට ගෙන ඇති වන්නේ **‘කරුණා රසයයි’**. ඉහත සිදුවීම් දැකීම තුල අනුකම්පා සහගත කෙනෙකු කෙරෙහි ‘ පව් ’ යන්න සිතුවිලි මුල් කොට ගෙන කරුණාවක් ඉපදීම තුල ඇති වන්නා වූ ශාරිරික වෙනස කරුණා රසය ලෙස පෙන්වා දිය හැකිය.





ඉහත රූප නිරීක්ෂණය කිරීමෙන් මුහුණේ ඇති ඉන්ද්‍රියයන්ගේ සිදුවන වෙනස් වීම් නම්,

- දැස් අඩවන්වීම
- නළල යම් ප්‍රමාණයකට රැළි වැටුණු ස්වභාවයක් ගැනීම.
- කම්මුල් හැකිලීම
- කඳුළු සැලීම
- උගුරකට වියලීම
- වැළපීම
- සුසුම්ලෑම
- අතපය අප්‍රාණික වීම

## <u>කාර්ය පත්‍රිකාව</u>

1. කරුණා රසය තුළින් දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

   1. පිළිකුල් කිරීම  2. අනුකම්පා කිරීම  3. සතුටුවීම  4. ආදරය කිරීම

2. සිතිවිලි මුල් කොට ගෙන උපදින්නේ,

   1. කරුණාව  2. බුද්ධිය  3. භාවය  4. සතුට

3. ශෝකභාවය හේතු කොට ගෙන උපාංගයන් තුළ සිදුවන වෙනස් කමකි.

   1. දැස් විවරවීම  2. මුව විවරවීම  3. දැස් අඩවන් වීම  4. කම්මුල් දෙපසට යාම

4. කරුණා රසය උද්දීපනයට බලපාන අවස්ථාවකි.

   1. මනාළියක් දැකීම  2. සිහමන් යදින්නකු දැකීම

   3. බුදු රුවක් දැකීම  4. සිහිත්තකු දැකීම.

➢ ඔබ උගත් රසභාවයන් ඇසුරින් පහත වගුව පුරවන්න.

| අවස්ථාව | භාවය | උපදින රසය |
|---|---|---|
| 1. යම් බරක් ඉහළට එසවීම | | |
| 2. පෙරහැරේ ඇතෙකු කුලප්පුවීම. | | |
| 3. හිමිදිරියේ මල් වත්තක් නැරඹීම | | |
| 4. තම හිතවතකු අහිමිවීම | | |
| 5. ශිෂ්‍යත්ව විභාගය සමත් වීම | | |
| 6. කඹ ඇදීම | | |

01. භාව ප්‍රකාශනයේදී ශරීරය බෙදෙන ප්‍රධාන කොටස් 3 ක් නම් කරන්න.

02. ශෝකය නමැති ස්ථායි භාවය නිරූපනයේදී ඇති වන රසය කුමක්ද ?.

03. ශෝකය භාවය නිරූපනයේදී ශරීරය තුළින් දැකිය හැකි ලක්ෂණයන් 4 ක් ලියන්න.

04. ශෝකය භාවය මුල් කොටගෙන උපදින රසය, උද්දීපනය සඳහා මුල් විය හැකි දෘෂ්‍ය මානවිය හැකි අවස්ථා 3 ක් ලියන්න.

05. මෙම භාවය නිරූපණයට සුදුසු සිද්ධියක් කෙටියෙන් ලියා දක්වන්න.

**නර්තනය**

9ශ්‍රේණිය III වාරය

ගුරුවරයාගේ නම : H.M. නදීකා ශිරෝමි අම්/ සේනාගම මහා විද්‍යාලය

නිපුණතාව : 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 3.3 පංචතූර්ය වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

## <u>පංචතූර්ය වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු රැස් කරමු.</u>

### <u>ඓතිහාසික පසුබිම</u>

පසඟ තුරු ගොස නැතහොත් පංචතූර්ය වාදනය ආගමික සහ සමාජ උත්සව සඳහා ඈත අතීතයේ සිටම යොදාගත් බව පැරණි වංශකතා සහ සාහිත්‍ය කෘති සාක්ෂි දරයි. පංචතූර්ය යන වචනය අපට ප්‍රථමයෙන්ම මුණගැසෙන්නේ මහාවංශයට ලියන ලද අටුවා ග්‍රන්ථයක් ලෙස සලකන වංසත්තප්පකාසිනිය නැමැති ග්‍රන්ථයෙහිය. ආතත, විතත ,විතතාතත ,ඝන සුසිර යනුවෙන් පංච වර්ගීක භාණ්ඩ පිළිබඳ තොරතුරක් එහි දැක්වෙයි. පංචතූර්ය යනු පංච වාරික භාණ්ඩ හෙවත් පස් වැදෑරුම් වූ තූර්ය භාණ්ඩ විශේෂයන් බව පෙනේ.

**නත්තෘ පංචාංගික චරිවං කාස"**

**ආතතං විතතං ආතත විතතා නාම**

**ශුෂිරය ඝනින්ති පංච විධෝ"**

යනුවෙන් මහාවංශ ටීකාවේ සඳහන් වේ. අශෝක අධිරාජයා විසින් ලක්දිවට ත්‍යාග වශයෙන් දක්ෂිණ බෝධි ශාඛාව එවන ලද අතර රජුගේ නියමය පරිදි බෝධි ශාඛාවට පැවැත්විය යුතු පූජා අතුරින් ඉතා උත්කෘෂ්ට ශබ්ද පූජාත්මක වූ පංචාංගික තූර්ය නාදය ද එලෙසම පැවැත්විය යුතු යැයි කියා එවූ බව මහාවංශයේ සඳහන් වේ. එතැන් පටන් ලක්දිව පසඟතුරු ගොස පැවත එන්නේ යැයි සිතිය හැකිය.

මෙම වාද්‍ය භාණ්ඩ වාදනය කරන ආකාරය අනුව කොටස් පහකට බෙදා දැක්විය හැකිය එනම්,

**ආතත විතත විතතාතත ඝන සුසිර**

❖ **ආතත** - අතින් පමණක් වාදනය කරන භාණ්ඩ ආතත ගණයට අයත් වේ.

→ ගැටබෙරය
→ යක්බෙරය
→ උඩැක්කිය
→ රබාන
→ බංකු රබාන
→ බුම්මැඩිය

❖ **විතත** - කඩිප්පුවක ආධාරයෙන් වාදනය කරන වාද්‍ය භාණ්ඩ ගණයට අයත් වේ.

→ තම්මැට්ටම
→ දවුලබෙරය

❖ **විතතාතත** - අතින් සහ කඩිප්පු වෙන් වාදනය කරන වාද්‍ය භාණ්ඩ මෙම ගණයට අයත් වේ.

→ දවුල.

❖ **ඝන** මේ සඳහා ලෝහමය ද්‍රව්‍ය වලින් නිර්මාණය කරන ලද වාද්‍ය භාණ්ඩ මෙයට අයත් වේ .

- **පන්තේරුව**
- **තාලම්පට**
- **තලිය**
- **අත්මිණිය**

❖ **සුසිර** සුලඟේ ආධාරයෙන් වාදනය කරන ලබන වාද්‍ය භාණ්ඩ මෙයට අයත් වේ.

- **බටනලාව**
- **හක්ගෙඩිය**
- **හොරණෑව**
- **කොම්බුව**



මේ ආකාරයට පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණය කළ හැකිය.

## වාදනය කරන අවස්ථා

- ආගමික උත්සව සඳහා කරන වාදන (පෙරහැර, පිරිත්පිංකම්, තේවා වාදන.)
- සමාජීය උත්සව සඳහා කරන වාදන (ශාන්තිකර්ම, තූර්යවාදන, සන්දර්ශන, ජාතික උත්සව, අවමංගල්‍යය උත්සව)

## කාර්ය පත්‍රිකාව

➢ නිවැරදි පිළිතුර යටින් ඉරක් අදින්න

1. පසග තුරු ගොස යනුවෙන් සඳහන් වන්නේ.

   1. හොරණෑව  2. පංචතූර්‍ය වාදනය  3. දවුල .  4තම්මැට්ටම

2. පංචතූර්ය යන වචනය අපට ප්‍රථමයෙන් මුණගැසෙන්නේ

   1. ථූපවංශය  2. සමන්තපාසාදිකාව.  3. වංසත්තප්පකාසිනිය.  4. කව්සිළුමිණ

3. අශෝක අධිරාජයා විසින් ලක්දිවට ත්‍යාග වශයෙන් එවන ලද්දේ.

   1. දක්ෂිණ බෝධි ශාඛාව.  2. ගැට බෙරය  3. රුවන්වැලිසෑය  4. අමා වතුර.

4. පංච තූර්ය නාදය එලෙසම පැවැත්විය යුතු යැයි කියා එවූ බව සඳහන් වන්නේ

   1. කව්සිළුමිණ.  2. දීපවංසයේ  3. මහා වංශයේ.  4. බුත්සරණ

2. වාද්‍යය භාණ්ඩ වාදනය කරන ආකාරය අනුව කොටස්

   1. පහ කි  2. හතර කි  3. අට කි  4. දෙක කි

3. තම් මැට්ටම වාදනය කරනු ලබන්නේ,

   1. අතිනි  2. කඩිප්පුවෙනි  3. අතින් සහ කඩිප්පුවෙනි  4.තාලම්පටෙනි

➢ නිවැරදි පිළිතුරු හිස්තැන මත ලියන්න

01. ආතත යනු ...................................................... භාණ්ඩ වේ.
02. ආතත භාණ්ඩ ගණයට.......................................... අයත් වේ.
03. විතතාතත යනු ......................................... වාදනය කරන භාණ්ඩ වේ.
04. විතතාතත භාණ්ඩ ගණයට.....................................අයත් වේ.
05. මහා වංශ ටීකාවේ සඳහන් වන........................ විසින් .........................ලක්දිවට ත්‍යාග වශයෙන් .............................. ශාඛාව එවන ලදී.

➢ පිළිතුරු ලියන්න

1. පංච තූර්‍ය වාදනය පිළිබඳ මහා වංශයේ සඳහන් ටීකාව ලියන්න.
2. වාදනය කරන ආකාරය අනුව වාද්‍ය භාණ්ඩ වර්ග කර දක්වන්න.
3. වර්ගීකරණයට අනුව එම වාද්‍ය භාණ්ඩ වාදනය කරන අවස්ථා නම් කරන්න.
4. ආතත වාද්‍ය භාණ්ඩ දෙකක රූප සටහන් අදින්න

**නර්තනය**

9 ශ්‍රේණිය III වාරය

ගුරුභවතාගේ නම : W.G. චින්තා පෙරේරා මිය අම්/ සද්ධාතිස්ස ජාතික පාසල

නිපුණතාව 2.0 : නර්තනය හා බැදි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශණය කරයි.

නිපුණතා මට්ටම 2.4 : විධි ක්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි.

## <u>වෛරෝඩි වන්නමේ සීරුමාරුව හා අඩව්ව</u>

| | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සීරුමාරුව | ත | ක | ට | දො | දොම් | - | තා | - | කඩ | තක | තරි | කිට |
| | ත | ක | ට | දො | දොම් | - | තා | - | | | | |
| අඩව්ව | ගත් | - | ත | තෙ | හි | ගු | ත | ක | ට | ත | කු | ද |
| | තක් | කඩ | ජික් | කඩ | තරි | කිට | ත | ක | ට | ත | කු | ද |
| | ග | ත | කු | තෙ | හි | ගු | ත | ක | ට | ත | කු | ද |
| | තා | - | තත් | කඩ | තරි | කිට | ජිත් | - | ජිත් | කඩ | තරි | කිට |
| | තොං | - | තොං | කඩ | තරි | කිර | තං | | | | | |

**මාත්‍රා 3+4 දෙතිතට ප්‍රස්තාර**

| | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උඩරට | ත | කුං | - | ජිං | - | ජිං | - | ත | ක | ට | දොම් | - | ත | ක |
| <u>පහතරට</u> | ගුං | - | ද | ග | ති | ග | ත | ගත් | - | ත | ගු | දි | ගු | ද |
| <u>සබරගමු</u> | කු | දක් | - | තක් | - | කි | ට | ත | ක | ට | ජි | මි | ත | ක |

**සිංහරාජ වන්නම ප්‍රස්තාර**

| | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | දො | දොං | - | ත | ත | කු | දොං | - | දො | දොං | - | ත | ත | කු | දොම් | - |
| තානම් | + | ත | නත් | ත | තෙ | න | තම් | - | - | ද | නත් | ත | තෙ | න | තම් | - |
| | + | ද | නත් | ත | තෙ | න | තම් | - | - | දන | තා | - | තා | - | ත | න |
| | + | ත | නත් | ත | තෙ | න | තම් | - | - | ද | නත් | ත | තෙ | න | තම් | - |
| | + | ද | නත් | ත | තෙ | න | තම් | - | - | දන | තා | - | තා | - | - | - |
| කවිය | + | පෙ | රත් | ක | ලෙ | ක | සි | හ | - | ර | ජෙක් | වැ | වු | ණි | ම | හ |
| | + | ළි | දක් | කු | ළ | ක | ඉ | සි | - | ල | වෙක් | ක | ර | පු | වැ | ඩ |
| | + | හැ | රත් | මෙ | හෙ | ම | ය | ස | - | වැ | ඩක් | ද | ණේ | - | හැ | ත |
| | + | පි | රත් | ක | ලෙ | ක | පැ | ව | - | තු | මක් | ය | පයි | - | හැ | ඩ |
| | + | දු | රත් | බැ | ලු | ම | තො | ව | - | ල | ගත් | බ | ල | න | අ | ය |
| | + | හ | වත් | එ | ලෙ | ස | වෙ | යි | - | කැ | වත් | ත | බ | මි | ද | ඩ |
| | + | ව | වත් | අ | ය | ට | දු | තෙ | - | න | වත් | කි | ය | මි | ම | ම |
| | + | ර | වක් | ව | පි | න | සි | හ | - | ර | ජ | වත් | න | මෙ | හැ | ඩ |
| කස්තිරම | තක | වත | කට | තක | තරි | කිට | කුත් | දත් | තක | වත | කට | තක | තරි | කිට | කුත් | දත් |
| | තක | වක | කට | තක | තරි | කිට | කුත් | දත් | රුං | තක | ජිං | තක | ජිං | තක | ජිං | කුඳ |
| | රුං | තක | ජිං | තක | ජිං | තක | ජිං | කුඳ | රුං | තක | ජිං | තක | ජිං | තක | ජිං | කුඳ |
| | තා- | ගග | ජිං | තක | තරි | කිට | කුත් | දත් | තා- | ගග | ජිං | තක | තරි | කිට | කුත් | දත් |
| | රුං | තක | ජිං | තක | තරි | කිට | කුත් | දත් | තා | | | | | | | |

කඩතුරා කවිය ප්‍රස්තාර කිරීම මාත්‍රා 3  තාලය

| 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | සි | හිත් | සි | ති | දු | ස | එ | ව | පැ | ල | ද |
| + | විත් | ල | න් | ම | ර | ග | න | - | - | - | - |
| + | ව | තුත් | ස | තු | ඔ | අ | ප | අ | න | හැ | ර |
| + | මත් | ද | ම | හ | ණ | වු | ණ | - | - | - | - |
| + | අ | හං | කා | - | ර | ඒ | - | ම | ර | ග | න |
| + | දුක් | කා | - | බු | දු | ගු | ණ | - | - | - | - |
| + | මිහි | න් | න | ලා | - | ධා | - | තු | බ | ලෙ | න් |
| + | සද | ති | ර | හ | රි | මි | න | - | - | - | ┤ |

“සිද්ධ මුනිදු වැඩසිට බෝ මුල විදුරාසන” යන කඩතුරා කවියද මාත්‍රා 3 තාලයට ප්‍රස්තාර කල හැකිය.

**පන් නෙලීමේ කවි ප්‍රස්තාර මාත්‍රා 3 තාලය**

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කො | ති | න් | කො | න | ට | පත් | - | - | - | - | - |
| ල | දු | රා | - | ගත් | | තේ | - | - | - | - | - |
| තැ | ති | න් | තැ | න | ට | පත් | - | - | - | - | - |
| අ | නු | රු | දු | මත් | - | තේ | - | - | - | - | - |
| අ | නු | න් | ගෙ | පත් | - | කො | ළ | - | - | - | - |
| එක් | - | තො | ක | රත් | - | තේ | - | - | - | - | - |
| බැ | ණු | න් | අ | හත් | - | න | ට | - | - | - | - |
| වෙ | යි | දු | න | ගත් | - | තේ | - | - | - | - | - |

“ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට” යන කවිය ද මාත්‍රා 3 තාලයට ප්‍රස්තාර කල හැකිය.

**ගොයම් කැපීමේ කවි ප්‍රස්තාර මාත්‍රා 4 තාලය**

| 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | රත් | - | දැ | - | - | - | කැ | - | ති | - | ගෙ | - | න | - |
| - | - | ති | ති | සැ | - | ර | - | සෙ | - | න | - | වා | - | - | - |
| + | + | රත් | - | ර | - | - | න් | ප | - | රි | - | ඉ | - | න | - |
| - | - | ව | ට | දි | - | ලි | - | සෙ | - | න | - | වා | - | - | - |
| + | + | රි | වි | දු | - | වු | - | පි | - | ති | - | බි | - | දු | - |
| - | - | ලෙ | ස | ප | - | හ | - | වෙ | - | න | - | වා | - | - | - |
| + | + | දුම් | - | බ | - | ර | - | තෙ | - | තෙ | - | අ | - | පි | - |
| - | - | ගො | ය | මි | - | ක | - | ප | - | න | - | වා | - | - | - |

**සොකරි කවි ප්‍රස්තාර මාත්‍රා 3 තාලය**

| 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සො | ක | රි | - | එත් | - | නී | - | ස | බ | ලයත් | - |
| අ | ව | ස | ර | ගත් | - | නී | - | - | - | - | - |
| නැ | වුම් | - | න | වත් | - | නී | - | තා | - | ලෙ | ට |
| රා | - | ග | කි | යත් | - | නී | - | - | - | - | - |
| ප | ද | අ | ල් | ලත් | - | නී | - | පි | ය | යු | රු |
| ළැ | ම | සො | ල | වත් | - | නී | - | - | - | - | - |
| කැ | ඩ | ප | න | ගත් | - | නී | - | සු | ර | තිත් | - |
| මු | හු | ණ | බ | ලත් | - | නී | - | - | - | - | - |

“වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ” යන කවිය ද මාත්‍රා 3 තාලයට ප්‍රස්තාර කල හැකිය

## කාර්ය පත්‍රිකාව

- නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න .

1. නිශ්ශබ්ද මාත්‍රා දැක්වීම සඳහා ...................................... ලකුණ යොදා ගනියි
2. තිත වැදීමත් සමඟ ගායනය ආරම්භ වීම ..................................... යනුවෙන් හැඳින්වේ
3. තිත වැදීමෙන් පසු ගායනය ආරම්භ වී............................................ යනුවෙන් හැඳින්වේ
4. ගුරු අක්ෂරයකට හිමි මාත්‍රා ගණන ..........................කි
5. ලඝු අක්ෂරයකට හිමි මාත්‍රා ගණන ..............................කි

- පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. වෛරොඩි වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

02. මැදුම් මහ දෙතිතට බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

03. කිරෙන් බැද්දත් කොබෙයියා
තෙලෙන් බැද්දත් කොබෙයියා
කිරෙන් බැද්දත් තෙලෙන් බැද්දත්
කොහොම බැද්දත් කොබෙයියා යන රබන් පදය අදාළ තාල රූප සොයා ප්‍රස්තාර කරන්න.

04. සිංහරාජ වන්නමේ කවියක් ප්‍රස්තාර කරන්න.

05. මාත්‍රා 4 තාලයට අයත් කස්තිරමක් ප්‍රස්තාර කරන්න.

06. මාත්‍රා 3 තාලයට අයත් කඩතුරා කවියක් ප්‍රස්තාර කරන්න.

07. ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට
මුහුණ පුරා තෙල් ගාගෙන යන කලට
මාන බලති මිනුවන් පන් තිබෙන කොට
නැනො නුඹත් එනවද පන් නෙලන්නට මෙම පන් නෙලීමේ කවිය මාත්‍රා 3+3 තාලයට ප්‍රස්තාර කරන්න.

08. මාත්‍රා 4 තාලයට අයත් ගොයම් කවියක් ප්‍රස්තාර කරන්න.

09. මාත්‍රා 3 තාලයට අයත් ගොයම් කවියක් ප්‍රස්තාර කරන්න.

10. වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙව්ලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
විදා පාන්නේ අත් දෙක තැගි කියන්නේ යන සොකරි කවිය මාත්‍රා 3 තාලයට ප්‍රස්තාර කරන්න.

| නර්තනය | | |
|---|---|---|
| 9ශ්‍රේණිය | III වාරය | |
| ගුරුවරයාගේ නම -:H.M. නදීකා ශිරෝමි | | අම්/ සේනාගම මහා විද්‍යාලය |

නිපුණතාව : 5.0 ශ්‍රී ලාංකේය නර්තන සාම්ප්‍රදාය හා සැබැදි ඓයිතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යනය
. උරුම ජාතික කරමින් රැක ගැනීම සඳහා ක්‍රියා කරයි
නිපුණතා මට්ටම : 5.2 ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රදායන් හා සබැදි තොරතුරු ඉදිරිපත් කරයි.

## පහන් මඩු ශාන්ති කර්මය

### ශාන්තිකර්ම යනු,

ශාන්තිකර්ම යනු කිසියම් පුද්ගලයෙකුගේ මානසික හෝ කායික හෝ සුභසිද්ධිය අරමුණු කොට දෙවියන් යක්ෂයන් නැතහොත් වෙනත් බලවේග දුරු කර ශාන්තියක් උදෙසා පවත්වන කිසියම් කාර්ය සංසිද්ධියකි.

### සබරගමු පහන් මඩු මඩු ශාන්ති කර්මය පැවැත්වීමට හේතු වූ කරුණු.

| අතීතයේ පැවැත්වීමට හේතුව | වර්තමානයේ පැවැත්වීමට හේතු |
|---|---|
| සේරමාන් රජුගේ හිසරදය සුවපත් කිරීම | ▪ අම්මා වරුන්ගේ ලෙඩ ලෙස ගැමියන් හඳුන්වන රෝග වලින් අත් මිදීම සඳහා,<br>▪ වසංගත රෝග සුවපත් කිරීම ,<br>▪ ගමට ප්‍රදේශයට රටට පැමිණි ව්‍යවසනයකින් මිදී සෙත් ශාන්තියක් ලබා ගැනීම<br>▪ සශ්‍රිකත්වය හා සෞභාග්‍ය උදා කර ගැනීම<br>▪ ස්වාභාවික විපත් වලින් ආරක්ෂා වීම ,<br>▪ අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා , |

### පුදලබන දෙවිවරු

- පත්තිනි දේවතාවිය
- විෂ්ණු දෙවියන්
- කතරගම දෙවියන්
- නාථ දෙවියන්
- වාහල දෙවියන්
- සමන් දෙවියන්
- විභීෂණ දෙවියන්
- දෙවොල් දෙවියන්

### ප්‍රචලිත ප්‍රදේශ

- රත්නපුර
- කළවාන
- කුරුවිට
- කොළොන්න
- ඇහැළියගොඩ
- බලන්ගොඩ දෙහිඕවිට කෑගල්ල

### පුරාවෘත්තය

සේරමාන් රජුගේ උයන පාළුකරමින් සිටි ගොනකු මරා දමන ලෙස රජු අණ කරන ලදි රජු කෙරෙහි වෛරයෙන් මිය ගිය ගෝනා පොකුනේ මැඩියෙකු වී ඉපදුනේය. පොකුණේ පිපී තිබූ මානෙල් මලක් සිඹිද්දි මැඩියා රජුගේ නාසයට ඇතුල් විය. ඉන් රජුට හිසරදයක් වැලදුනි. රජු සිහිනෙන් රූමත් කාන්තාවක් දැක පුරෝහිතයන්ගෙන් විමසීමේදී ඔවුන් පවසා සිටියේ ඒ පත්තිනි දේවතාවිය බවයි. පසුව ලංකාවේ රුවන් වැල්ල ප්‍රෙද්ශයේ පත්තිනි දේවතාවිය වෙනුවන් කරන ලද ශාන්ති කර්මය නිසා රජුගේ හිසරදය සුව විය. මෙම ශාන්ති කර්මය පසු කලෙක පහන් මඩුව නමින් ප්‍රචලිත විය

**ප්‍රධාන ඇඳුම් කට්ටලය**

පබළු ඇඳුම් කට්ටලය



**ප්‍රධාන වාද්‍ය භාණ්ඩ**

දවුල



**පහන් මඩු සැරසිලි අංග**



## ශාන්තිකර්ම හා සබැඳි නර්තන, ගායන,වාදන, චාරිත්‍ර විධි සහ සැරසිලි

- **පූර්ව චාරිත්‍ර**

  වී සහල් වෙන් කිරිම    කප් සිටුවීම    ගස් පේ කිරීම

- **මඩු දිනට පෙර දින සහ මඩු දින චාරිත්‍ර**

  මඩු පේ කිරීම.    තොට පේ කිරීම (තොට මෙට යෑම)    මිල්ල කැපීම

- **සැරසිලි**

  පත්තිනි තොරණ    දෙවොල් තොරණ    මල් යහන් (දෙවිවරුන්ට)    කාල පන්දම් ගස

- **වාදන අවස්ථා**

  මංගල දවුල් වාදනය

- **ගායනයට ප්‍රමුඛතාව හිමි වන අවස්ථා**

  දේවාරාධානාව    සෙත් පැතීමේ සිරසපාද ගායනා

- **නර්තනය ප්‍රමුඛව යෙදෙන අංග**

  යහන් දැක්ම    කොලොනන පද    පන්දම් පද

❖ **ගායනය සමග යෙදෙන නර්තන**

හත්පද පෙළපාලි    තොරණ දැක්ම    දළු මුර පිදීම

❖ **නාට්‍යමය පෙළපාළි**

දෙවොල් ගොඩ බැසීම    පොත් කඩේ පාළිය    රාමා යක්කම    අසුර යක්කම

❖ **ඒකල නර්තන**

හත් පද නැටීම

❖ **සමූහ නර්තනය**

තෙල්මේ    මල්පද නැගීම

**<u>කාර්ය පත්‍රිකාව</u>**

➢ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

1. සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය වනුයේ.
   1. දෙවොල් මඩුව    2. පහන් මඩුව    3. කොහොඹා යක් කංකාරිය    4. කිරිමඩුව

2. පහන් මඩුව ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණක් නොවන්නේ.
   1. සශ්‍රීකත්වය ලබා ගැනිම    2.අස්වනු සරුසාර කරගැනීම
   3. වසංගත උවදුරු මර්ධනය    4. දරුඵල අපේක්ෂාව

3. පහන්මඩු ශාන්තිකර්මය ප්‍රචලිත ප්‍රදේශ ලෙස
   1.ගාල්ල, මාතර    2. උඩුනුවර, දුම්බර
   3. රත්නපුර, පැල්මඩුල්ල    3. මාතර , සත්කොරලය

4. පහන් මඩු ශාන්තිකර්මයේ පුදලබන දෙවිවරු වන්නේ
   1. කොහොඹා දෙවි තුන් කට්ටුව, වීරමුණ්ඩ දෙවි    2. පත්තිනි දෙවි, දෙවාල් දෙවි
   3. රුප්පායකුන්, කන්දෙයකුන්    4. අමරාපති, මහා කොහොඹා

5. පහන්මඩු ශාන්ති කර්මයේ පුරාවෘතය ලෙස,
   1. මලය රජුගේ දිවි දෝෂය    2. සේරමාන් රජුගේ කතාපුවත
   3. පත්තිනි පාලඟ කතාපුවත    4. පඩුවස් දෙව් රජුගේ දිවි දෝෂය

➢ නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න

1. සේරමාන් රජුට වැළඳි රෝගය ..............................නම් විය.

2. පහන්මඩු ශාන්ති කර්මය පුරාවෘත කතාවේදී හමුවන චරිතයන් ....................හා ........................වේ.

3. පහන් මඩුවේ චාරිත්‍රයකි ............................ වැඩම වීම

4. පහන් මඩුවට ආවේණික ප්‍රධාන ඇඳුම......................වේ.

5. පහන් මඩුවේ සැරසිළි අංගයකි...............................පන්දම වේ .

➢ පිළිතුරු ලියන්න

1. පහන් මඩු ශාන්ති කර්මය පැවැත්වීමේ මූලික අරමුණ කුමක්ද?

2. මෙම ශාන්ති කර්මයේ උපත් කතාව කෙටියෙන් ලියන්න.

3. මෙම ශාන්ති කර්මයේ නර්තන අංග මොනවා ද?

4. මෙම ශාන්ති කර්මයේ චාරිත්‍ර විධි පහක් නම් කරන්න

5. මෙහි දක්නට ලැබෙන නාට්‍යමය අවස්ථා මොනවා ද?

**නර්තනය**

9 ශ්‍රේණිය                III වාරය

ගුරුභවතාගේ නම :- K.G.නදීකා නිමාලි රාජපක්ෂ                අම් / පරගහකැලේ ම.වි

නිපුණතාව : 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම : 5.3 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි.

## <u>නර්තන ශිල්පීන් අගයමු</u>

නර්තන කලාව අද්‍යාතනයෙහි අතිශයින් ජනප්‍රිය ප්‍රාසාංගික කලාවකි. එය වෘත්තීයමය කාරකයක් බවට පත් ව ඇත්තා පමණක් නොව රටට විදේශීය විනිමය උපයා දෙන ශ්‍රී ලාංකීය අනන්‍යතාවය හා ශ්‍රේෂ්ඨත්වය ලෝකෙට පෙන්වා දෙන්න කලා මාධ්‍යයක් බවට පත්ව තිබේ. එහෙයින් අප ඉගෙන ගන්නා දේශීය නර්තන කලාවට ඉමහත් සේවයක් කළ කලාකරුවන් ගේ චරිතාපදානයන් පිළිබඳ අධ්‍යයනය කොට අවබෝධයක් ලබාගත යුතුය.

### <u>අරනෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා</u>



1925 දී ගලපිටමඩ ගම්මානයේ උපත ලද ඉඹුල්ගොඩ, ඉසොහාමි හා පොඩි සිංඤො යුවළගේ දෙවන පුතා විය. ඔහුට සහෝදර සහෝදරියන් එකොළොස් දෙනෙක් විය. 8 වැනි ශ්‍රේණිය දක්වා පාසල් අධ්‍යාපනය ලද ඉඹුල්ගොඩ මහතා මංගලතිරිය ගුරුතුමා යටතේ නර්තනය හා ගායනය පුගුණ කළේය. ඉන් පසුව අල්ගම කිරිගණිත ගුරුතුමාගෙන් උඩරට නර්තනය හදාරා දක්ෂ උඩරට නර්තන ශිල්පියෙක් බවට පත්විය. ලංකා ගාන්ධර්ව විභාගය සමත් වී සිටි ඉඹුල්ගොඩ මහතා වැඩිදුර අධ්‍යාපනය සඳහා ඉන්දියාවට ගොස් ශ්‍රී ගෝපිනාත් යටතේ කතකලි නර්තනය පිළිබඳ පුහුණුවක් ලැබිය.

### <u>අරනෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමාගෙන් සිදු වූ සේවාව</u>

- 1951දී බෙන්තොට ගාමිණි විද්‍යාලයේ නැටුම් උපදේශක ලෙස සේවය කිරීම
- 1954 දී බලපිටිය ගුරු විද්‍යහලේ නැටුම් කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කිරීම.
- 1956 රජයේ ලලිත කලායතනයේ කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කිරීම.
- සෙසු නර්තන ශිල්පීන්ට වඩා ඔහුටම ආවේණික වූ ශෛලියක් අනුව නර්තනය ගොඩ නගා ගැනීම.
- උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ශාස්ත්‍රීය නර්තනාංග ඒකාකාරී රටාවෙන් බැහැරව සාම්ප්‍රදායික ලක්ෂණයන්ට සහ එහි අනන්‍යතාවන් ට හානි නොවන ආකාරයට ආකර්ෂණය ලෙස ඉදිරිපත් කිරීම .
- භාරතීය නර්තනය විවිධ හැඩතල හා රිද්මය කොට නවතම සජීවී නර්තන ශෛලියක් බිහි කිරීම.
- බෲනායි, තායිලන්තය, සහ ජර්මනිය, යන රටවල සංචාරය කරමින් උඩරට නැටුමේ අගය ලොවට හෙළි කිරීම.
- රංජනා තංගරාජා යන අය සමඟ එක්වී විජයාවතරණය, ජානකීහරණය, සහ උන්මාද චිත්‍රා යන මුද්‍රා නාට්‍යවල රඟපෑම.

- 1957 දී උදාව නම් මුද්‍රානාට්‍ය ද, 1961දී වේදනා නැමැති මුද්‍රානාට්‍ය ද, 1968 දී රන් දද නැමැති මුද්‍රා නාට්‍යය ද නිෂ්පාදනය කිරීම

උඩරට නර්තන කලාවේ ප්‍රගමනයට ශ්‍රේෂ්ඨ දායකත්වයක් ලබාදීමට කටයුතු කළ ශිල්පියෙකු වූ මෙතුමා ඉතා දක්ෂ ගායකයෙක් වන අතර 1986 දී ජනාධිපතිවරයා අතින් කලා භූෂණ සම්මානයෙන් පිදුම් ලැබීය.

## විල්සන් ඔලබොඩුව ගුරුතුමා



නිර්මාණ ශක්තියත්, ප්‍රතිභාවත්, නර්තන කුසලතාවත්, පරිපාලන කාර්යයේ දක්ෂතාවත් එක් පුද්ගලයෙකු තුළ පිහිටනුයේ කලාතුරකිනි. එවන් දක්ෂතා සහිතව කලුතර දිස්ත්‍රික්කයේ ඔලබොඩුවට නම් ග්‍රාමයේ ජන්ම ලාභය ලද විල්සන් ප්‍රනාන්දු හෙවත් විල්සන් ඔලබොඩුව මහතා පහතරට නර්තන සාම්ප්‍රදායේ රයිගම් ශෛලියේ ප්‍රගුණ කළ නර්තන හා වාදන ශිල්පියෙකි. නර්තන ශිල්පය මෙන්ම වාදන ශිල්පී පිළිබඳවද අති දක්ෂතා ප්‍රකට කළ මෙතුමා උඩරට හා පහතරට බෙර වාදන මෙන්ම පෙර අපර දෙදිග විවිධ තූර්ය භාණ්ඩ වාදනය කිරීමේ ද දක්ෂතා දැක්වූවෙකි.

## විල්සන් ඔලබොඩුව ගුරුතුමා ගෙන් වූ සේවාව

- 1960 දශකයේ මුල් භාගයේ දී රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය) කථිකාචාර්යවරයකු ලෙස කටයුතු කිරීම.
- එතෙක් විධිමත්ව නොපැවති පහතරට නර්තනයේ හස්ත පාද ක්‍රමවත්ව ගොඩනැගීම
- ඒස්. එල්. එච්. ප්‍රනාන්දු, කේ. ඒස්. ප්‍රනාන්දු, සව්රිස් සිල්වා, යන ගුරුවරුන් සමග එක්වී පහතරට නර්තනයේ එතෙක් නොපැවති පා සරඹ හා ඉලංගම් සරඹ නමින් සරඹ පද්ධති දෙකක් නිර්මාණය කිරීම.
- මාතර හා බෙන්තර ශෛලීන් වශයෙන් පැවැති ශුද්ධ මාත්‍රා නැටුමේ පද කොටස් එක්කොට වර්තමානයේ භාවිතයේ පවතින ශුද්ධ මාත්‍රය නිර්මාණය කිරීම.
- පහතරට සම්ප්‍රදායේ දෙවොල් පද හත හා සූරල් හත ක්‍රමවත් අයුරින් සකස් කිරීම.
- සාම්ප්‍රදායික නර්තන අංග මෙන්ම නව නර්තනාංග කිහිපයක් නිර්මාණය කොට රංග ලීල නමින් ප්‍රසංගයක් පැවැත්වීම.

## කාර්ය පත්‍රිකාව

➢ නිවැරදි පිළිතුර තෝරන්න.

1. විල්සන් ඔලබොඩුව ගුරුතුමා දක්ෂතා දැක්වූ නර්තන සම්ප්‍රදාය වන්නේ,

| | |
|---|---|
| 1 උඩරට නර්තන සම්ප්‍රදාය | 2 පහතරට නර්තන සම්ප්‍රදාය |
| 3 කථක් නර්තන සම්ප්‍රදාය | 4 සබරගමු නර්තන සම්ප්‍රදාය |

2. අරුනෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා දක්ෂතා දැක්වූ නර්තන සම්ප්‍රදාය වන්නේ,

| | |
|---|---|
| 1 උඩරට නර්තන සම්ප්‍රදාය | 2 පහතරට නර්තන සම්ප්‍රදාය |
| 2 භරත නර්තන සම්ප්‍රදාය | 4 සබරගමු නර්තන සම්ප්‍රදාය |

3. ඉඹුලොගොඩ ගුරුතුමා නිෂ්පාදනය කළ මුද්‍රා නාට්‍යයක් නොවන්නේ,

| | |
|---|---|
| 1 උදාව | 2 රන්දද |
| 3 කරදිය | 4 වේදනා |

4. වර්තමානයේ පවතින ශුද්ධ මාත්‍රා යේ නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ,

| | |
|---|---|
| 1 එස්. පණිභාරත මහතා | 2 විල්සන් ඔලබොඩුව මහතා |
| 3 අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා | 4 නිත්තවෙල ගුණයා මහතා |

5. දක්ෂ ගායකයෙක් ලෙස හැඳින්වෙන්නේ,

| | |
|---|---|
| 1 අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා | 2 සවුරිස් සිල්වා මහතා |
| 3 විල්සන් ඔලබොඩුව මහතා | 4 රද්දැල්ලේ පොඩිමහතා |

➢ හිස්තැන් පුරවන්න.

1. "රංග ලීල" ප්‍රසංගය පැවැත්වූයේ .................................... ගුරුතුමා.
2. අරනෝලිස් ඉඹුල්ගොඩ මහතාගේ මුල්ගුරුතුමා වන්නේ ................................... ගුරුතුමාය.
3. 1986 දී කලාභූෂණ සම්මානයෙන් පිදුම් ලැබුවේ............................................
4. විධිමත්ව නොතිබුණු පා සරඹ හා ඉලංගම් සරඹ විධිමත්ව සකස් කිරීමේ ගෞරවය

   හිමිවන්නේ...................................... ගුරුතුමාටය.
5. අර්නෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා දොලොස් දෙනෙක් යුත් පවුලේ .................................

➢ පිළිතුරු ලියන්න.

1. දෙවොල් පද හත හා සුරල් පද හත ක්‍රමවත්ව සකස් කරන ලද්දේ කවුරුන් විසින් ද?
2. අරනෝලිස් ඉඹුල්ගොඩ මහතා රංජනා රංගරාජා සමග එක්වී එළි දැක්වූ මුද්‍රා නාට්‍ය මොනවා ද?
3. භාරතීය නර්තන ශෛලීන් බිහිකළේ කවුරුන් විසින් ද?
4. විල්සන් ඔලබොඩුව ගුරුතුමාගෙන් සිදු වූ සේවාව පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
5. ඉඹුල්ගොඩ ගුරුතුමාග්ගෙන් උඩරට නර්තන කලාවට සිදු වූ සේවාව අගයන්න.

**නර්තනය**

9 ශ්‍රේණිය III වාරය

ගුරුවරයාගේ නම -:H.M. නදීකා ශිරෝමි අම්/ සේනාගම මහා විද්‍යාලය

නිපුණතාව : 6:0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

නිපුණතාව :6.1 වෙනත් සංස්කෘතියකට අයත් නර්තන සම්ප්‍රධායක් අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.

## කථක් නර්තන සම්ප්‍රධාය

උත්තර භාරතීය නර්තන සම්ප්‍රදායක් වන කථක් මහා රාෂට්‍රය, ගුජරාට්, රාජස්ථාන්, දිල්ලි, ලක්නව් ආදී ප්‍රදේශයන්හි ප්‍රචලිත නර්තන විශේෂයකි. කථක් නර්තනය මුල්කාලයේ මෙම ප්‍රදේශයන්හි කෝවිල්වල ආගමික නර්තනයක් වශයෙන් පැවත 16 වන සියවසේ මුල් භාගයේ සිට මෝගල් රජවරුන්ගේ රාජ සභා නර්තනයක් බවට පත්විය. මේ අනුව රාජ සභා නර්තනය භාරතයේ වැඩි වශයෙන් සංවර්ධනය විය. පසු කාලයේදී උත්තර භාරතයේ ජාතික නර්තනයක් ලෙස සංවර්ධනය වුයේ මෙම කථක් නර්තනයයි.

කථක් යන්නෙහි අදහස කතාවක් කීම යන්නයි. කථක් නර්තනය කථා කීමේ කලාව ඇසුරෙන් විකාශනයට පත් වූවකි. මහා භාරතය, රාමායනය, භගවත් ගීතාව නම් විය. කාව්‍යන්හි ඇතුලත් ආගමික කතන්දර සමාන්‍ය ජනයාට පැහැදිලි ලෙස තේරුම් කර දී විස්තර කථනයන්හි යෙදුන පිරිස් ඔවුන්ගේ ජීවන උපාය කරගත්තේ මෙකී කතා කීමේ කාර්යයයි. මොවුහු කථක යන නමින් හඳුන්වන ලදි. එම කථා කීමේදී දෙබස් කවි අගපසග චලන මුහුනේ ඉරියව් පාදක කර ගත්හ.

## කථක් නර්තන සරානා (ගුරුකුල)

කථක් නර්තනය ප්‍රධාන වශයෙන් **සරානා** හතරකි මෙම .**සරානා** එක් එක් ප්‍රදේශවල ප්‍රචලිත වූ අතර විවිධ පුද්ගලයන්ගේ දායකත්වය අනුව ගොඩ නැගුණි.

- ලක්නව් සරානා - නවාබ් වජීඩ් අලිෂා 19 වන ශත වර්ෂයේදී ගොඩ නැගු නර්තන සම්ප්‍රදායකි.
- ජායිපූර් සරානා - ජායිපූර් ප්‍රදේශයේ ගොඩනැගු නර්තන සම්ප්‍රදායකි.
- බෙනාරිස් සරානා - බෙනාරිස් ප්‍රදේශයේ ගොඩනැගු නර්තන සම්ප්‍රදායකි.
- රායිගර් සරානා - රායිගර් ප්‍රදේශයේ ගොඩනැගු නර්තන සම්ප්‍රදායකි.

### සංගීත සම්ප්‍රධාය

උත්තර භාරතීය හින්දුස්ථානි සංගීත සම්ප්‍රධාය කථක් නර්තනයේ සංගීත සම්ප්‍රධායයි. පදනම් රාග . කරගත් සංගීතය භාවිතා කරන අතර වාදනය සඳහා තබ්ලාව, සර්පිනාව,සිතාරය, පක්වාජ් තාම්පුරාව සාරංගිය,බටනළාව භාවිතයට ගැනේ.









තබ්ලාව පක්වාජ් සර්පිනාව සිතාරය සාරංගී

<u>රංග වස්ත්‍රාභරණ</u>

කථක් නර්තනය සඳහා භාවිතයට ගන්නා රංග වස්ත්‍ර හින්දු හා මුස්ලිම් සංස්කෘතිය අනුව සකස් වී ඇත. දැනට ඛඩාත් භාවිත වන්නේ රාජ්පුට් වංශවතුන්ගේ ඇඳුමට සමාන වූ රංග වස්ත්‍රය.






නර්තන ශිල්පියකුගේ රංග වස්ත්‍රාභරණ කට්ටලය.

<u>අධ්‍යාපන ආයතනය</u>

- දිල්ලි කථක් කේන්ද්‍රය
- භාත්ඛන්ඩේ විශ්වවිද්‍යාලය

<u>කථක් නර්තන අංග</u>

- **භූමි වන්දනා** - භූමියට අධිපති දෙවගන වෙනුවෙන් කරන නමස්කාරයකි.
- **ආමද්** - ප්‍රථම නර්තන අංගය මෙය වේ මෝගල් බලපෑම හේතු කොට ගෙන ඇති වූ නර්තන අංගයකි.
- **සලාම්** - සලාම් යනු ආචාර කිරීමයි. නර්තනය නැරඹීමට පැමිණ සිටින්නවුන්ට ආචාර කොට පිළිගැනීම මෙමගින් සිදුකෙරේ
- **.බෝල්** - බෝල් යන පදය කථක් නර්තනයේදී පක්වජ්, තබ්ලා යන අවනද්ධ භාණ්ඩ වලින් වාදනය කරන පද හැඳින්වීමට යොදන වචනයකී. විවිධ ලය අනුව තාලයෙහි දක්ෂතා පෙන්වීම සම් ස්ථාන මත පදය ඇතුලත් කිරීම සඳහා කරනු ලබන සුවිශේෂ ක්‍රියාකාරකම් මේ සඳහා ඇතුලත්ය.
- **පරණ්** - කථක් නර්තනයට යොදා ගන්නා පද විශේෂයකි. පක්වජ් හෝ තබ්ලාවෙන් වාදනය කෙරේ අක්ෂර මනා ගැඹුරුය. මේ අනුව ප්‍රදර්ශනය වන නර්තනයද මෙනමින් හඳුන්වයි.
- චක්‍රධාර් - කථක් නර්තනයේදී යොදා ගනු ලබන වට කරකැවීමයි.
- ගත් - භාව ප්‍රකාශනයට ප්‍රමුඛස්ථානයක් දෙන නර්තනයකි.
- තත්කාර් - ලය හා තාලය මත පිහිටා නර්තනයෙහි යෙදමින් නර්තකයා තම දක්ෂතාව ප්‍රකට කරයි.

<u>කථක් නර්තන ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීහු</u>

නවාබ් වලීජ් අලීෂා කථක් නර්තනය සම්බන්ධව ග්‍රන්ථ රචනා කර ඇත.



බිර්ජු මහාරාජ්



අච්චන් මහරාජ්



නවාබ් වලීජ් අලීෂා

**<u>කාර්ය පත්‍රිකාව</u>**

➢ <u>නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න</u>

01. කථක් නර්තනය ප්‍රචලිත ප්‍රදේශයකි.

1. මහාරාෂ්ට්‍ර ය  2. තාන්ජෝරය  3. දක්ෂිණ භාරතය  4. කේරළ

02. කථක් නර්තනය පිළිබඳ ග්‍රන්ථ රචනා කළ රජු .

1. අච්චන් මහාරාජ්  2. නවාබ් වලීජ් අලීෂා  3. බාලා සරස්වතී  4. බිර්ජු මහාරාජ්

03. කථක් නර්තන අංග ලෙස

1. ආමත්  2. ශබ්දම්  3. තිල්ලානා  4. රාස්ලීලා

➢ නිවැරදි පිළිතුර ලියන්න

1. කථක් නර්තන සම්ප්‍රදායේ සංගීත සම්ප්‍රදාය ....................................වේ.
2. කථක් නර්තන අධ්‍යාපන ආයතන .......................... හා ........................... වේ.
3. කථක් නර්තන සම්ප්‍රදායේ .........................හා............................තාල වාද්‍ය භාණ්ඩය ලෙස යොදා ගනී.
4. කථක් නර්තන සම්ප්‍රදායේ සුසිර වාද්‍ය භාණ්ඩයකි ...................................
5. කථක් නර්තනය සඳහා භාවිතයට ගන්නා රංග වස්ත්‍ර .................... හා ...............................
.සංස්කෘතිය අනුව සකස් වී ඇත
6. මෙම සම්ප්‍රදායේ දැනට භාවිත වන රංග වස්ත්‍රය වනුයේ .................................ඇඳුමට සමාන වූ රංග වස්ත්‍රයයි.
7. කථක් යන්නෙහි අරුත................................................ වේ .

➢ පිළිතුරු ලියන්න

1. කථක් නර්තනයේ ආගමික පසුබිම හඳුන්වන්න.
2. කථක් නර්තනයේ රංගවස්ත්‍ර පිළිබඳ හැඳින්වීමක් කරන්න.
3. හින්දුස්ථානි සංගීත වාද්‍ය භාණ්ඩ නම් කර. එක් වාද්‍ය භාණ්ඩයක් චිත්‍රයට නගන්න.
4. කථක් නර්තන අංග 2ක් පිළිබඳ හැඳින්වීමක් කරන්න
5. කථක් නර්තන සම්ප්‍රදායේ සරානා නම් කර 2ක් හඳුන්වන්න

## නර්තනය

9 ශ්‍රේණිය III වාරය

ගුරුභවතාගේ නම : ඊ. පී. සවනි දිනේශිකා අම්/ උක්සිරිපුර විද්‍යාලය

නිපුණතාව : 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

නිපුණතා මට්ටම : 6.2 දේශීය නාට්‍ය ශෛලි අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි.

### දේශීය නාට්‍ය වර්ග

නාට්‍ය යනු යමක් කර පෙන්වීම යනුවෙන් සරලව හැඳින්විය හැකිය. නාට්‍යයක් ඉදිරිපත් කරන ආකාරය අනුව ශෛලීන් දෙකක් භරත මුනිවරයා විසින් ඉදිරිපත් කර ඇත..

### ලෝක ධර්මී ශෛලිය

ලෝකයේ ස්වභාවයට අනුකූලව සතර අභිනය භාවිත කරමින් ඉදිරිපත් කරන නාට්‍ය , ලෝක ධර්මී ශෛලිය ලෙස හඳුන්වයි. පවත්නා ලෝකයට වඩාත් සමීපව ඉදිරිපත් කරන මෙම නාට්‍ය පවතින සමාජය ඒ අයුරින්ම ඉදිරිපත් කරයි.

### නාට්‍ය ධර්මී ශෛලිය

නාට්‍ය ලෝක ස්වභාවයෙන් බැහැරව සතර අභිනය යොදා ගනිමින් ඉදිරිපත් කරනු ලබන නාට්‍ය, නාට්‍ය ධර්මී ශෛලියයි. එහීදී රංග වස්ත්‍ර, අදහස් ප්‍රකාශනය මෙන්ම අංග චලනද, ලෝක ස්වභාවයට අනුගත නොවන අයුරින් සිදු වේ. උදා - සාමාන්‍ය ඇවිදීම, තාලානුකූල රංගනයක් ලෙස ඉදිරිපත් කරයි.

### ලංකාවේ නාට්‍ය වර්ග

- තාත්වික නාට්‍ය (ලෝක ධර්මී ශෛලිය)
- ශෛලිගත නාට්‍ය (නාට්‍ය ධර්මී ශෛලිය)
- ගීත නාට්‍ය (නාට්‍ය ධර්මී ශෛලිය)
- මුද්‍රා නාට්‍ය (නාට්‍ය ධර්මී ශෛලිය)

### තාත්වික නාට්‍ය

ස්වභාවික ලෙස ගැනෙන එදිනෙදා ජීවිතයේ සිදුවන සිද්ධියක් ඒ අයුරින්ම ඉදිරිපත් කිරීම තාත්වික නාට්‍යයි. තාත්වික නාට්‍ය යථානුරූපී ස්වභාවයෙන් ම ඉදිරිපත් කරන අතර නරඹන්නාට එය තමාගේ අත්දැකීමක් වශයෙන් විඳ ගැනීමට සලස්වනු ලබයි.



කැළණි පාලම



මෝදර මෝල

පවතින සමාජ තත්ත්වය ඒ ආකාරයෙන්ම පෙන්වයි. ඇඳුම් පැළඳුම් පසුතල අංගරචනය සාමාන්‍ය ජීවිතයට සමානය.

<u>ශෛලීගත නාට්‍ය</u>

ස්වභාවික තත්වයෙන් මිදී අතිශයෝක්තියෙන් වර්ණනා කෙරෙන නාට්‍ය විශේෂයකි. අභිනය (ආංගික අභිනය, වාචික අභිනය, සාත්වික අභිනය, ආහාර්ය අභිනය) ස්වභාවිකත්වය ඉක්මවා අතිශයෝක්තියෙන් ඉදිරිපත් කරන බවද දැකිය හැකිය. තාලය හා රිද්මය පදනම් කොට ගෙන දෙබස් උච්චාරණය මෙන්ම නර්තනය යොදා ගැනීම මෙහිදී දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. ව්‍යවහාර භාෂා ශෛලිය ඉක්මවා සම්භාව්‍ය ලක්ෂණ දක්නට ලැබෙන භාෂාව මෙහිදී දැකිය හැකිය. එමෙන්ම වේෂ නිරූපන, ඇඳුම් පැළඳුම් හා වේදිකා භාණ්ඩ යනාදිය පවතින ස්වභාවයට වඩා මතුකර දැක්වීම සිදු වේ. අභිනයන් මගින් චරිත නිරූපණය සිදු කරන අතර ගමන් විලාස හා අවස්තා නිරූපනය බෙර තාල සහිත ව සිදු වේ. ආවේනික වූ ශෛලියක් අනුගමනය කරමින් පොතේ ගුරු මගින් චරිත වේදිකාවට කැඳවීම සමඟම ඒ ඒ චරිත වේදිකාවට පිවිසෙයි.




දයානන්ද ගුණවර්ධන මහාතාගේ

| | |
|---|---|
| නරි බෑණා | මධුර ජවනිකා |




එදිරිවීර සරච්චන්ද්‍ර මහාතාගේ

| | |
|---|---|
| මනමේ නාට්‍ය | සිංහබාහු නාට්‍ය |





හෙන්රි ජයසේන මහතාගේ

| | |
|---|---|
| හුණුවටය නාට්‍ය | කුවේණි නාට්‍ය |

<u>**ගීත නාට්‍ය**</u>

මෙම නාට්‍යවල දී ප්‍රමුඛස්ථානය ලබා දෙන්නේ වාචික අභිනයට ය. නාට්‍යයට අදාළ සියලුම දෙබස් ගීතයෙන් ඉදිරිපත් කෙරෙන අතර ගීත නාට්‍ය රඟ දැක්වීමේදී නළු නිලියන් විසින්ම ගායනය කළ යුතු හෙයින් ඔවුන්ට ගායනය සහ රංගනය යන දෙකෙහි ම දක්ෂතා තිබිය යුතුය. අදහස් ප්‍රකාශනයේදි ගීතය සමඟ රිද්මයානුකූල චලන යොදා ගැනිම විශේෂත්වයකි. සරච්චන්ද්‍ර මහතාගේ .ප්‍රේමතෝ ජායතී සෝකෝ, මකුලොළුව මහතාගේ දෙපානෝ, ප්‍රේමසිරි ඛේමදාස මහතාගේ කැළෑ මල් ආදී නාට්‍ය ගීත නාට්‍ය වලට උදාහරණ වේ.



# <u>මුද්‍රා නාට්‍ය</u>

මුද්‍රාව එක් භාෂා ක්‍රමයකි. වචනයෙන් අදහස් ප්‍රකාශ නොකොට අත් පා චලනයෙන් හා මුහුණේ විවිධ ස්වරූප මවා දක්වමින් අදහස් ප්‍රකාශ කිරීම මුද්‍රා නාට්‍යයයි. එනම් වාචික අභිනයෙන් තොරව චලන මාධ්‍යයෙන් කිසියම් තේමාවක් පදනම් කොටගෙන නිර්මාණය කරන ලද මුද්‍රා මගින් අදහස් ප්‍රකාශ කරන නාට්‍ය මුද්‍රා නාට්‍ය වේ. මෙහිදී අදහස් පැහැදිලි කරන්නේ සංගීතයෙනි. සංගීතයට ප්‍රබල තැනක් හිමි වේ. සංගීතයට අනුව නර්තන මාධ්‍යයෙන් කතා පුවත ඉදිරිපත් කරනු ලබයි. ශ්‍රී ලාංකීය මුද්‍රා නාට්‍යය කලාවෙහි ප්‍රභවය කෙරෙහි සෘජුව ම බලපා ඇත්තේ ඉන්දියානු නර්තන කලාවයි. . ආගම මූලාශ්‍ර කොට ගත් කථා පුවත් ගෙන රංගනයෙහි යෙදෙන අවස්ථා බොහෝ ඇත. නූතනයේ බටහිර මුද්‍රා නාට්‍යවල ආභාසයෙන් සමහර ශිල්පීන් මුද්‍රා නාට්‍ය බිහිකර ඇති බව පෙනේ. 1936 ශාන්තිදේව ඝෝෂ් නිෂ්පාදනය කළ **සීතාහරණ** නම් මුද්‍රා නාට්‍යය ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රා නාට්‍යය ලෙස නම් කර ඇත. දේශීය මුද්‍රා නාට්‍යය **ඉඟිනළු** යනුවෙන්ද හඳුන්වා ඇත. පෙර අපර දෙදිග ප්‍රචලිත වූ මෙම නාට්‍ය ක්‍රමය බටහිර ජාතීන් හැදින්වූයේ **බැලේ** යන නමිනි. හංසවිල මුද්‍රා නාට්‍ය බටහිර මුද්‍රා නාට්‍ය අතර ප්‍රමුඛ පෙළේ මුද්‍රා නාට්‍යකි.

චිත්‍රසේන මහතා - කරදිය , නලදමයන්ති, චණ්ඩාලිකා, ශිවරංග

වජිරා මහත්මිය - හිම කුමාරි, රන් කිකිළි

ප්‍රේමකුමාර එපිටවෙල මහතා - සැලළිහිණිය, පරෙවිය, ගමන

එස්. පණිභාරත මහතා - සත් පත්තිනි , ග්‍රහ අපලය

ඉඹුල්ගොඩ මහතා - උදාව , රන්දද








## කාර්ය පත්‍රිකාව

❖ හිස් තැනට අදාල පිළිතුර ලියන්න

1. ස්වභාවික සම්ප්‍රදාය ඉක්මවා යන නාට්‍ය ශෛලිය හඳුන්වන්නේ....................... නාට්‍ය වශයෙනි.
2. නාට්‍ය ධර්මී ශෛලිය අනුව .................... .................... .................. යනුවෙන් නාට්‍යය ප්‍රභේද තුනකි.
3. අතිශයෝක්තියෙන් වර්ණනා කෙරෙන නාට්‍ය ශෛලිය ................. නමින් හඳුන්වයි.
4. එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ..................... , ........................... යන නාට්‍ය ශෛලීගත නාට්‍ය ගණයට අයත් වේ.
5. රංගනයේ යෙදෙන නළු නිළියන් විසින් ම දෙබස් ගායනා ඉදිරිපත් කෙරෙන නාට්‍ය .............................. නමින් හැඳින්වේ.
6. දෙපානෝ ගීත නාට්‍ය ............................... මහතාගේ නිර්මාණයකි.
7. ශාන්ති දේව සෝෂ් නිෂ්පාදනය කළ ............................. නම් මුද්‍රා නාට්‍ය ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රා නාට්‍ය වේ.
8. කරදිය මුද්‍රා නාට්‍ය .......................... මහතා විසින් නිර්මාණය කරන ලදී.
9. දේශීය මුද්‍රා නාට්‍ය ...................................... යනුවෙන් හඳුන්වා ඇත.
10. .......................... ප්‍රමුඛ පෙලේ බටහිර මුද්‍රා නාට්‍යයකි.

❖ යා කරන්න

| |
|---|
| සත් පත්තිනි |
| උදාව |
| ගමන |
| ශිවරංග |
| ග්‍රහ අපලය |
| චණ්ඩාලිකා |
| රන්දද |

චිත්‍රසේන මහතා

වජිරා මහත්මිය

ප්‍රේමකුමාර එපිටවෙල මහතා

ඉඹුල්ගොඩ මහතා

එස් පණිභාරත මහතා

| |
|---|
| රන් කිකිළි |
| හිම කුමාරි |
| රන්දද |
| සැලළිහිණිය |
| නලදමයන්ති |
| පරෙවිය |
| කරදිය |

❖ පිළිතුරු සපයන්න

01.භරතමුනි පඬිවරයා හඳුන්වා දෙන නාට්‍ය ප්‍රභේද දෙක නම් කරන්න.

02.ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන නාට්‍ය හතරක් දක්වන්න.

03.ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ හා මුද්‍රා නාට්‍ය කලාවේ පියවරු දෙදෙනා නම් කරන්න

04. සතර අභිනය නම් කරන්න

**නර්තනය**

9 ශ්‍රේණිය 111 වාරය

ගුරු භවතාගේ නම: ඩී.ඩී.එස්. පුෂ්පලතා අම්/ බණ්ඩාරනායක බා.ජා.පා.

නිපුණතාව : 7.0 අත්දැකීම් ඇසුරු කර ගනිමින් ප්‍රාසාංගික කලා නිර්මාණය.

නිපුණතා මට්ටම : 7. 1 නිර්දේශිත ගීතයට සවන් දී ගීතයේ පසුබිම හඳුනාගනිමු.,

: 7. 2 ගීතයට අනුව නර්තන නිර්මාණය කරයි.

පාඩම - ගීත අනුව නර්තන නිර්මාණය කිරීම අද්‍යතන ප්‍රාසාංගික කලාවන් හි දක්නට ලැබෙන්නකි. එබැවින් එම ගීත වල තාල රටාව, නාද රටාව අවබෝධ කරගෙන ගීත ගායනය කිරීම හා නර්තන ඉදිරිපත් කිරීම සිදු කරයි.

## අක්කේ අක්කේ අර බලන්නකෝ

අක්කෙ අක්කෙ අර බලන්නකෝ
වැස්සක් නොවැ එන්නේ ...//

හෝ හෝ හෝ ගා ගෙන එන්නේ
ගස් ගල් පෙරළෙන්නේ ..//

සුළං තදයි විදුලියද කොටයි හෙණ හඬ පැතිරෙයි
මහ වලාකුළක් මේ එන්නේ

අක්කේ වී පැදුරත් මිදුලේ
අකුලා ගෙට ගන්නේ ..//
අම්මත් අර නා ගෙන එන්නේ //
මල්ලි තවම කුඹුරේ //

සුළං තදයි විදුලියද කොටයි හෙණ හඬ පැතිරෙයි......

නංගි සුදෝ මගෙ හඬන්ටෙපා
අම්ම හනික දැන් එයි ...//
බිල්ලො නොවෙයි ඔය ගොරවන්නේ //
අහසේ හෙණ නාදේ //

සුළං තදයි විදුලියද කොටයි හෙණ හඬ පැතිරෙයි......

අක්කේ දර ටික ගෙට ගනිමු
වැහි පොද වැටෙනවනේ ...//
වතුරත් ඉවරයි කළ ගෙඩියේ //
හනික ළිඳට යමුකෝ //

සුළං තදයි විදුලියද කොටයි හෙණ හඬ පැතිරෙයි.....

අක්කෙ අක්කෙ අර බලන්නකෝ.......




පද රචනය - ආනන්ද සමරකෝන්

සංගීතය - ආනන්ද සමරකෝන්

ගායනය - සූරිය ශංකර් මොල්ලිය ගොඩ

වී.පී. ලීලාවතී

එදිනෙදා ජීවිතයේ අත්දකින අවස්ථාවක් වන වැස්ස වැහැගෙන එන මොහොත චමත්කාරජනක ලෙස සිතුවිලි මවමින් රචනා කල ගීතයකි. මෙහි යොදාගෙන ඇති භාෂාව ඉතා සරලය. කෙටි වැකි යොදා ගෙන ගීතය අර්ථ ගන්වා රසවත්ව ඉදිරිපත් කර ඇත.

# රන්වන් දූල් කරලින් පැසිලා.......

කෘෂිකාර්මික ජන ජීවන රටාවක් ගත කරන ගැමි පරිසරයක ජීවත්වන ගොවියන් ගෙවිලියන් තම කෘෂිකාර්මික ජීවිතයේ සිදුකරන ලබන යම් යම් සංසිද්ධි කිහිපයක්ද සශ්‍රීකත්වය හා ඔවුන්ගේ ගැමි සංස්කෘතිය පිළිබඳ මෙම ගීතයෙන් අර්ථ ගැන්වේ.

- දුවේ පුතේ මෙම ගීත දෙක අන්තර්ජාලය හර හා හොඳින් ශ්‍රවණය කරන්න.

දිනිඳා උදය ගිර මුදුනෙන් නැග එනවා
සුරිඳා පිහිට යැද ගොවි කුඹුරට යනවා

(රන්වන් දූල් කරලින් පැසිලා
නැමිලා බර වී.....ලා
තල වැවිලා රමණී සෝභා
කෙත්වතු පිරිලා සාරා
හෝ කෙත්වතු පිරිලා සාරා
හෝ කෙත්වතු පිරිලා සාරා)...//

ඉහ නලවා කපමු නෙලමු හෝ.. ඕ.. යියා
ඉහ නලවා කපමු නෙලමු හෝ.. ඕ.. යියා
මිටි බැඳලා හිස මත ගනිමු
යාමු පෙල සැදිලා.....
යාමු පෙල සැදිලා......
යාමු පෙල සැදිලා......

මිටි බැඳලා හිස මත ගනිමු
යාමු පෙල සැදිලා.....
බටලී සංගීතේ මත්වූ ගවයෝ රැලේයා
ගොපලුන් හා මීහිරේ වෙලිලා
යාවී රංචු හෝයියා
හෝ යාවී රංචු හෝයියා..
හෝ යාවී රංචු හෝයියා..

රන්වන් දූල් කරලින් පැසිලා
නැමිලා බර වී.....ලා..
තල වැවිලා රමණී සෝභා
කෙත්වතු පිරිලා සාරා
හෝ කෙත්වතු පිරිලා සාරා
හෝ කෙත්වතු පිරිලා සාරා

මද සුළඟේ කුල්ලෙන් පොලලා හෝ.. ඕ.. යියා
මද සුළඟේ කුල්ලෙන් පොලලා හෝ.. ඕ.. යියා
තල වේලා බොල්පොතු හැරලා
කමතේ පිරි ධා...න්‍යා
කමතේ පිරි ධා...න්‍යා
කමතේ පිරි ධා...න්‍යා

තල වේලා බොල්පොතු හැරලා
කමතේ පිරි ධා...න්‍යා
සැම දෙවියෝ පිහිටාධාරෙන් කරුණා ලැබීලා
ගම සාරයි හාමත දුරුවී
ගොවි සිත ප්‍රීති හෝයියා
හෝ ගොවි සිත ප්‍රීති හෝයියා
හෝ ගොවි සිත ප්‍රීති හෝයියා

(රන්වන් දූල් කරලින් පැසිලා
නැමිලා බර වී.....ලා..
තල වැවිලා රමණී සෝභා
කෙත්වතු පිරිලා සාරා
හෝ කෙත්වතු පිරිලා සාරා
හෝ කෙත්වතු පිරිලා සාරා)...//

www.lklyrics.com



චිත්‍රපටිය - මාතලන්

පද රචනය - බෙනඩික් ප්‍රනාන්දු

සංගීතය - ආර්. මුත්තුස්වාමි

ගායනය - ලතා වල්පොල

- ගීත වල අදහස තේරුම් ගැනීමට උත්සාහ කරන්න.
- ගීතය කිහිප වරක් ගායනා කරන්න උනන්දු වන්න.
- ස්වභාව සෞන්දර්යය විඳින්න.

## කාර්ය පත්‍රිකාව

- **අක්කේ අක්කේ ගීතයෙන් ප්‍රශ්න.**

1. ගීතයේ සඳහන් පරිදි වැසි දිනක දක්නට ලැබෙන ලක්ෂණ තුනක් ලියන්න.
2. මෙම ගීතයේ තාල රූපය කුමක්ද?
3. මෙම ගීතයේ පද රචනය කළේ කවුරුන්ද?
4. මෙම ගීතයේ සංගීතය නිර්මාණය කළේ කවුරුන්ද?
5. මෙම ගීතය ගායනා කරන්නේ කවුද?
6. මෙන්ම ගීතයේ නියමිත තාල රටාව සහ නාදමාලාව අවබෝධ කරගෙන ගායනා කරන්න.
7. එම ගීතයේ ඔබ කැමති කොටසක අර්ථය ප්‍රකාශ වන ආකාරයට නර්තනයක් නිර්මාණය කරන්න.

- **රන්වන් දූන් කරලින් පැසිලා ගීතයෙන් ප්‍රශ්න**

1. මෙම ගීතය පද රචනය කළේ කවුරුන්ද?
2. මෙම ගීතය සංගීතවත් කලේ කවුද?
3. මෙම ගීතය ගායනා කරන්නේ කවුද?
4. මෙම ගීතය ඇතුලත් චිත්‍රපටය කුමක්ද?
5. මෙම ගීතයේ තාල රූපය සඳහන් කරන්න.
6. ගැමියා තුළ පවතින ආගමික භක්තිය හා ඇදහිලි විශ්වාස ගීතය තුළ සඳහන් කර ඇත්තේ කෙසේද?
7. ගැමි ලියන්ගේ සුන්දරත්වය කියා පෑමට කවිපදරචකයා විසින් යොදාගත් වචන දෙකක් තෝරා ලියන්න.
8. ගීතයේ අදහස ප්‍රකාශ වන ආකාරයට නර්තනයක් ඉදිරිපත් කරන්න.